# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 46 — 1973 පෙබරවාරි 09 වැනි සිකුරාදා — 1973.02.09**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (II ආ) වැනි ඡේදය — පලකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | 185 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... ... | 198 |
| තීරණය කළ ටෙන්ඩර්පත් පිළිබඳ දැන්වීම් ... ... | 197 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... ... | 197 | වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... | 201 |
| කොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... ... | — | විවිධ දැන්වීම් ... ... ... | 201 |


සැලකිය යුතුයි.—අධිකරණ භාෂා (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත 1973 පෙබරවාරි 02 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**කොළඹ වරාය කොමිෂන් සභාව**

නැව් කටයුතු හා සංචාරක කටයුතු අමාත්‍යාංශයේ ටෙන්ඩර් මංඩලයේ සභාපති තුමා විසින් දැනට කොළඹ වරාය භූමිය තුළ ඇති සුන්බුන් යකඩ ටොන් 10,000 ක් පමණ මිලදී ගැනීම සඳහා ප්‍රාදේශීය සහ විදේශීය ටෙන්ඩර්කරුවන්ගෙන් 1973 මැයි මස 11 දා පෙ. ව. 9.30 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ. 1973 මැයි මස 11 වැනි දින පෙ. ව. 10.00 ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර් කරුවන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයින්ට එහි පෙනී සිටින්ට අවසර දෙනු ලැබේ.

2. ටෙන්ඩර් පිළිබඳ ලිපි ලේඛණ කොළඹ වරාය කොමිෂන් සභා කාර්යාලයේ දී පරීක්ෂා කළ හැක. රු. 2,500 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් කොළඹ වරාය කොමිෂන් සභාවේ සරප් තැන වෙත තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් කොන්දේසි වලට අනුව සාර්ථක ටෙන්ඩර්කරුට ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු ගෙවනු ලැබේ. ටෙන්ඩර් කොන්දේසි අනුව පිළිපැද ඇත්තේ නම්, සාර්ථක ටෙන්ඩර්කරු ගිවිසුම අත්සන් කළ පසු ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද අනිකුත් ටෙන්ඩර් කරුවන්ටද ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට අදහස් කළ ටෙන්ඩර්කරුවන් තමන්ගේ හිස් ටෙන්ඩර් ලියකියවිලි ටෙන්ඩර් මංඩලයේ සභාපති තුමා වෙත ටෙන්ඩර් විවෘත කිරීමට පෙර ලැබෙන්නට එවා ඇත්තේ නම් ඔවුන්ට ද ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු ගෙවනු ලැබේ. නැව් කටයුතු හා සංචාරක කටයුතු අමාත්‍යාංශයේ ටෙන්ඩර් මංඩලයේ සභාපති තුමාට 1973 මැයි මස 11 වැනි දින පෙරවරු 9.30 ට පෙර ලැබෙන පරිදි ටෙන්ඩර් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ටෙන්ඩර් ලියාපදිංචි තැපෑලෙන් එවීමට අදහස් නොකරන ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් කොළඹ 1, චැතැම් වීදියේ අංක 54 ස්ථානයේ ඇති නැව් කටයුතු හා සංචාරක කටයුතු අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් තුමාගේ කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි, තමන්ගේ ටෙන්ඩර් තැන්පත් කළ යුතුය.

3. 1973 මැයි මස 09 වැනිදා දහවල් 12 දක්වා ටෙන්ඩර් ලියකියවිලි නිකුත් කරනු ලැබේ.

සී. ලුඩිකන්ස්,
වරාය කොමසාරිස්,
නැව් කටයුතු හා සංචාරක කටයුතු අමාත්‍යාංශයේ
ටෙන්ඩර් මංඩලයේ සභාපති තුමා වෙනුවට.

කොළඹ වරාය කොමිෂන් සභාව,
කොළඹ-1, 1973. 01. 09 දින.

2–349—73.02.09 දින අංක 46 දරණ ගැසට් පත්‍රය

---

**සැලකිය යුතුයි**

**ශ්‍රී ලංකා ජනරජයේ සතිපතා පළවන ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II අ) සහ (II ආ) වැනි ඡේදයෙහි පළවිය යුතු දැන්වීම් ගැසට් පත්‍රය පළවන සතියට පෙර සතියේ බදාදා දවල් 12.00 ට පෙර රජයේ මුද්‍රණාලයට ලැබිය යුතුයි. ප්‍රමාදවී ලැබෙන දැන්වීම් කුමන හේතුවක් නිසාවත් භාරගනු නොලැබේ.**

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්,**
**ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.**

**1972 දෙසැම්බර් මස 15 වැනි දින,**
**ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,**
**කොළඹ.**

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### ගොඩනැගිලි ඉදිකිරීම

පේරාදෙණිය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් පහත සඳහන් ගොඩනැගිලි ඉදිකිරීම සඳහා 1973 පෙබරවාරි මස 23 වැනි දින ප. ව. 2 දක්වා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. පේරාදෙණිය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සිවිල් ඉංජිනේරු අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (ඉංජිනේරු) තැනගෙන් ලබාගත හැකි ටෙන්ඩර් ආකෘති පත්‍ර පිටපත් දෙකකින් යුක්තව පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය. ඔහුගෙන් රූප සටහන්, විශේෂ විස්තර හා වෙනත් තොරතුරු ලබාගත හැකිය.

3. මේ සඳහා ටෙන්ඩර් කළ හැක්කේ රජයේ සෑම දෙපාර්තමේන්තුවකම කොන්ත්‍රාත් ක්‍රියාත්මක කිරීම සඳහා රු. 70,000 කට වැඩි වටිනාකමින් යුත් ලියාපදිංචි, හා මාස 4 කින් නිමකිරීම සඳහා ගොඩනැගිලි ද්‍රව්‍ය, කම්කරුවන්, ඉතා පහසුවෙන් ලබාගත හැකි කොන්ත්‍රාත් කරුවන්ටය. කෘෂිකර්ම අධ්‍යක්ෂකට සතුටුදායක ලෙස නියමිත කාලය තුළ ගොඩනැගිලි නිම කිරීමට නොහැකි කොන්ත්‍රාත් කරුවන් ටෙන්ඩර් කළයුතු නොවේ.

බිට—7301—ව්‍යාප්ති මධ්‍යස්ථානය, පුලස්තිගම, අනුරාධපුර දිස්ත්‍රික්කය.

බිට—7302—ව්‍යාප්ති මධ්‍යස්ථානය, රම්බෑව, අනුරාධපුර දිස්ත්‍රික්කය.

බිට—7303—ව්‍යාප්ති මධ්‍යස්ථානය, මඩුල්ල, මොණරාගල දිස්ත්‍රික්කය.

බිට—7304—ව්‍යාප්ති මධ්‍යස්ථානය, අරණායක, කෑගල්ල දිස්ත්‍රික්කය.

බිට—7305—ව්‍යාප්ති මධ්‍යස්ථානය, ගලේවෙල, මාතලේ

බිට—7306—වී ගබඩාව 100×40, බණ්ඩාරගම, කළුතර දිස්ත්‍රික්කය.

බිට—7307—වී ගබඩාව 100×40, යටියන, මාතර දිස්ත්‍රික්කය.

4. (අ) 3 වැනි ඡේදයේ සඳහන් ලියාපදිංචි කිරීමේ ලියවිලිද,

(ආ) රු. 50 ක ටෙන්ඩර් තැන්පත් මුදල් කුවිතාන්සියක් ද, ඉදිරිපත් කළ විට 1973 පෙබරවාරි මස 22 වැනි දින ප. ව. 2 දක්වා ටෙන්ඩර් ආකෘතිපත් නිකුත් කරනු ලැබේ.

5. ටෙන්ඩර් තැන්පත් මුදල් පේරාදෙනියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ කච්චේරියක හෝ කෘෂිකර්ම අධ්‍යක්ෂගේ අංක 37 ගිණුමට බැර කරමින් කොළඹ යෝර්ක් වීදියේ ලංකා බැංකු ශාඛාවේ තැන්පත් කළ යුතුය.

එල්. ආර්. එල්. පෙරේරා,
කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවට.

1973 ජනවාරි මස 25 වැනි දින,
පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ
සිවිල් ඉංජිනේරු අංශයේ දී ය.

2–247—73.02.09 දින අංක 46 දරණ ගැසට් පත්‍රය

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### 1973 මුදල් වර්ෂයේ 1 වන බාගය තුළ, පොළොන්නරුව ඉඩම් සංවර්ධන නිලධාරි සීටතේ ඇති ව්‍යාපාරයන් සඳහා ගොඩනැගිලි ඉදිකිරීමේ ද්‍රව්‍ය සැපයීම සඳහා මිළ ගණන් කැඳවීම

පොළොන්නරුව, මාතලේ සහ මඩකලපුව දිස්ත්‍රික්කයන් තුළ පිහිටි පහත සඳහන් කාර්යාංශවලට පහත සඳහන් ගොඩනැගිලි ද්‍රව්‍යයන් සැපයීම සඳහා 1973. 02. 25 වැනි දින පෙරවරු 10 දක්වා පොළොන්නරුව ඉඩම් සංවර්ධන නිලධාරි විසින් මිළ ගණන් භාරගනු ලැබේ.

පොළොන්නරුව දිස්ත්‍රික්කය.—පිඹුරත්තාව, අඹගස්වැව හා බේබියා වැව.

මාතලේ දිස්ත්‍රික්කය.— හත්තොට අමුණ.

(අ) මඩකලපුව දිස්ත්‍රික්කය.—කිරිමච්චිමඩේ.

1. 6"×9" කලුගල් (කියුබ් ගණනින්) ගල්වල ව්‍යාපාරයේ සිට සැ. 10 ක් ඇතුලත විය යුතුය.

2. 2" කැටගල් (කියුබ් ගණනින්) ගල්වල ව්‍යාපාරයේ සිට සැ. 10 ක් ඇතුලත විය යුතුය.

3. 1 1/2" කැට ගල් (කියුබ් ගණනින්) ගල්වල ව්‍යාපාරයේ සිට සැ. 10 ක් ඇතුලත විය යුතුය.

4. 1" කැටගල් (කියුබ් ගණනින්) ගල්වල ව්‍යාපාරයේ සිට සැ. 10 ක් ඇතුලත විය යුතුය.

5. 3/4" කැටගල් (කියුබ් ගණනින්) ගල්වල ව්‍යාපාරයේ සිට සැ. 10 ක් ඇතුලත විය යුතුය.

6. පිළිස්සුනු ගඩොල් (1,000 බැගින්) පිළිගත් (ප්‍රමාණය $8\frac{3}{4}'' \times 4\frac{1}{2}'' \times 2\frac{3}{4}''$) පෝර්තුව ව්‍යාපාරයේ සිට සැ. 10 ක් ඇතුලත විය යුතුය.

7. වියලු පොල් අතු (1,000 බැගින්).

8. අලුහුණු (බුසල් ගණනින්) ගෝනි සමග.

9. තම්බාපු හුණු (බුසල් ගණනින්) ගෝනි සමග.

(ආ) සැපයීම පිළිබඳ මිළ ගණන් වෙන් වෙන් වශයෙන් දැක්විය යුතුය :

(1) පෝරනුවේදී/ගල්වලේදී (ලොරිය යා හැකි ස්ථානය විය යුතුය.)

(2) කායයිස්ථානයට ගෙනවුත් භාරදීම.

(ඇ) ඒ ඒ ව්‍යාපාරයට වෙන වෙනම රුපියල් 50 බැගින් මෙම කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් අනුමත ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට පෙර ඉදිරිපත් කළ යුතුයි. 1973 පෙබරවාරි මස 24 වැනි දින දවල් 12 දක්වා ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

(ඈ) මෙම කාර්යාලයෙන් සපයනු ලබන නියමිත ටෙන්ඩර් පොර්මවල ඉල්ලුම් කළ යුතු අතර ඒවා ලිපි කවරයක බහා සීල් තබා 1973 පෙබරවාරි මස 25 වැනි දින පෙරවරු 10 ට පෙර මෙම කාර්යාලයේ ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමීම හෝ ඉඩම් සංවර්ධන නිලධාරි, පොළොන්නරුව යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ කළ හැකිය. ටෙන්ඩර් බහා එවන කවරයේ වම් පස උඩ කෙළවරේ "ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීම සඳහා ටෙන්ඩර්" යනුවෙන් සඳහන් කළ යුතුය.

(ඉ) 1973. 02. 25 වැනි දින පස්වරු 2 ට පොළොන්නරුව ඉඩම් සංවර්ධන නිලධාරීගේ කාර්යාලයේදී ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටිය හැකිය.

(ඊ) සාර්ථක වූ ටෙන්ඩර්කරුට ඇණවුම් කළ විට ඔහු විසින් සති දෙකක් ඇතුලතදී ද්‍රව්‍ය බාර දිය යුතුය. යමෙකුට එසේ කිරීමට නොහැකි වුවහොත්, මහුගේ නම කොන්දේසි කඩකල කොන්ත්‍රාත් කරුවන්ගේ නාම ලේඛනයට ඇතුලත් වන්නේ ය.

(උ) ටෙන්ඩර් ගණනාවක් හෝ සියළුම ටෙන්ඩර් ප්‍රතික්ෂෙප කිරීමේ බලය, ටෙන්ඩරයක කොටසක් භාරගැනීමේ අයිතිය හා විශේෂ විස්තරයකට අනුකූල නොවූ සැපයීම් ප්‍රතික්ෂෙප කිරීමේ අයිතිය පොළොන්නරුව ඉඩම් සංවර්ධන නිලධාරියා සතුය.

(ඌ) තවද, වැඩි විස්තර පොළොන්නරුවේ ඉඩම් සංවර්ධන නිලධාරිගෙන් ලබාගත හැකිය.

ඇස්. දිවකලාල,
පොළොන්නරුව ඉඩම් සංවර්ධන නිලධාරී.

1973 පෙබරවාරි මස 04 වැනි දින.
පොළොන්නරුව ඉඩම් සංවර්ධන කාර්යාලයේ දී ය.

2–222—73.02.09 දින අංක 46 දරණ ගැසට් පත්‍රය

---

## වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

කොළඹ තැ.පෙ. 509 දරණ ස්ථානයේ පිහිටි වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙහි ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් එන්ජින් මගින් ක්‍රියාකරන වතුර පොම්ප දෙකක් සැපයීම සඳහා 1973 මාර්තු මස 7 වෙනි දින පෙරවරු 10 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. ඉහත සඳහන් ස්ථානයෙහි පිහිටි වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැකි ආකෘති පත්‍ර මත පිටපත් 2 කින් යුක්තව ටෙන්ඩර් සකස් කළ යුතුය. රු. 100ක ටෙන්ඩර් තැන්පත් මුදලක් වෙනුවෙන් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් මේ ආකෘති පත් 73. 3. 6 වන දින පස්වරු 3 දක්වා කාර්යාල වේලාවන් තුළදී ලබාගත හැක.

3. ටෙන්ඩර් දැන්වීම් හා අනෙකුත් විස්තර සඳහා ඉහත සඳහන් ලිපිනයෙන් ඉල්ලුම් කරන්න.

එල්. සී. ඒ. ද එස්. වීජේසිංහ,
වන සංරක්ෂක වෙනුවට.

2–287—73.02.09 දින අංක 46 දරණ ගැසට් පත්‍රය

## දැන්වීමයි

හෝමාගම ප්‍රා. ආ. නි. කොට්ඨාසයේ රුක්මලේ වල්ගම්වත්ත ජනපදයේ පාරෙහි ඇති කළුගල් කියුබ් 50 ක් පමණ කැඩීම සඳහා ප්‍රදේශයේ රජයේ ඉඩම්වල කළුගල් කැඩීමේ බලපත්‍ර කරුවන්ගෙන් හා කොන්ත්‍රාත්කරුවන්ගෙන් මිල ගණන් කැඳවනු ලැබේ.

කළුගල් කියුබ් 1 ක් කැඩීම සඳහා අය කරන මුදල ටෙන්ඩර් පත්‍රයෙහි සඳහන් කළ යුතුය. කොළඹ දිසාපතිගේ අභිමතය පරිදි කැඩිය යුතු ගල් කියුබ් ගණන තීරණය කරනු ඇත.

රු. 10 ක් ගෙවා කොළඹ දිසාපතිගෙන් 1973 පෙබරවාරි මස 7 වැනි දින පෙරවරු 12 දක්වා ටෙන්ඩර් පෝරම ලබාගත හැක. ටෙන්ඩර් පත්‍ර 1973 පෙබරවාරි මස 10 වැනි දින පෙරවරු 12 ට පෙර කොළඹ දිසාපති වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ මෙම කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමීමට පුළුවන. 1973 පෙබරවාරි මස 12 වැනි දින පෙරවරු 11 ට කොළඹ දිසාපති විසින් ටෙන්ඩර් විවෘත කරනු ඇත.

ටෙන්ඩර් බහාලන කවරයේ වම් කෙළවරෙහි උඩින් රුක්මලේ වල්ගම්වත්ත කළුගල් කැඩීම යනුවෙන් සඳහන් කළ යුතුය.

වැඩි විස්තර කොළඹ දිසාපති කාර්යාලයේ ඉඩම් අංශයෙන් ලබා ගත හැක.

ඩී. ජී. පල්ලියගුරු,
කොළඹ දිසාපති වෙනුවට.

1973 ජනවාරි මස 22 දින,
කොළඹ දිසාපති කාර්යාලයේ දී ය.

2–221—73.02.09 දින අංක 46 දරණ ගැසට් පත්‍රය

---

## ශ්‍රී ලංකා ගුවන් හමුදාව

කොළඹ 2, තැ. පෙ. 594, ශ්‍රී චිත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානයේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1973 පෙබරවාරි මස 28 දින පෙරවරු 10 තෙක් පහත සඳහන් සැපයීම් සඳහා වෙන් වෙන් වශයෙන් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

(1) කිරි බෑග්ස් සුදු හෝ නිල් අළු පාට (කැන්වස්) 200 යි.
(2) ජර්සි නිල් අළුපාට 350 යි.
(3) මේස් නයිලෝන් කළු පාට කුට්ටම් 7,000 යි.
(4) වැසි කබා (ග්‍රවුන්සීට්) කරපටිය සමග 900 යි.
(5) මුහුණ පිසින තුවා 7,000 යි.
(5) සපත්තු පොලිෂ් කළු ටින් 18,000 යි.
(7) වැරහැලි රාත්තල් 15,000 යි.

2. ටෙන්ඩර් පත් ලබාගැනීමට ප්‍රථම පළමුවෙනි ඡේදයෙහි සඳහන් එක් එක් ටෙන්ඩරය සඳහා නැවත ලබාගත හැකි රු. 100 ක මුදලක් මෙම මූලස්ථානයේ සිවිල් පාලක හා ගණකාධිකාරී වෙත තැන්පත් කර රිසිට් පතක් ලබාගත යුතුයි. 1973 පෙබරවාරි මස 27 වෙනි දින දහවල් 12 තෙක් ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ.

3. වැඩි විස්තර කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානයෙන් දැන ගත හැක.

පී. එච්. මෙන්ඩිස්,
එයාර් කොමඩෝර්,
ගුවන් හමුදාපති.

2–285—73.02.09 දින අංක 46 දරණ ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

**බතලගොඩ සහ වාරියපොල රජයේ ගොවිපලවල ලෙලි පොල් විකිණීම**

කුණ්ඩසාලේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පාසැල් ගොවිපලේ ගොවිපලේ පාලන හා නිෂ්පාදන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් බතලගොඩ සහ වාරියපොල රජයේ ගොවිපලවල තිබෙන පහත සඳහන් ලෙලි පොල් තොග විකිණීම සඳහා සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර පහත සඳහන් කොන්දේසි අනුව 1973 පෙබරවාරි මස 23 වන දින පස්වරු 2 වනතෙක් භාරගනු ලැබේ.

බතලගොඩ ගොවිපල—ලෙලි පොල් 14,000 ක් පමණ.

වාරියපොල ගොවිපල—ලෙලි පොල් 8,000 ක් පමණ.

(i) පොල් විකිණීම සඳහා තෝරාගනු ලබන ටෙන්ඩර්කරුට ඒ බව දන්වා සති දෙකක් ඇතුළතදී ගොවිපලේ කළමනාකරුට සම්පූර්ණ පොල් තොගය සඳහා මුළු මුදල ගෙවා භාරගෙන එකී පොල් තොගය ගොවිපලින් බැහැර කරගත යුතුය. මොනම හේතුවක් නිසාවත් පොල් තොග මිලදී ගැනීම සඳහා දෙනු ලබන කාලය නැවත දීර්ඝ කරනු නොලැබේ.

(ii) පොල් තොගය භාරගැනීමේදී කිසියම් පිළිවෙලකට වර්ග කිරීමකට ඉඩ නැත. එමෙන්ම පුහු වූ හෝ කුණු වූ හෝ කුඩා වූ හෝ වර්ග කිරීමට ඉඩ නැත.

2. කුණ්ඩසාලේ, ගොවිපල් පාලනය හා නිෂ්පාදන කාර්යාලයෙන් ලබාගන්නා ලද පෝර්මවල ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුතුයි.

සෑම ටෙන්ඩර් පත්‍රයක්ම දෙපිටපතකින් යුක්ත විය යුතු අතර, නිසිලෙස අත්සන් කොට මුද්‍රා තැබූ කවරවල බහා "කුණ්ඩසාලේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පාසැල් ගොවිපලේ ගොවිපල් පාලනය හා නිෂ්පාදන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති" නමට ඉදිරිපත් කළ යුතුයි. කවරයෙහි ඉහළ වම් කෙළවරෙහි බතලගොඩ /වාරියපොළ රජයේ ගොවිපලේ ලෙලි පොල් මිළට ගැනීම කියා සඳහන් කළ යුතුයි.

3. එක් එක් ටෙන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රුපියල් 25 ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් පෝර්ම ලබාගත හැක. 1973 පෙබරවාරි මස 21 වන දින දවල් 11 වනතෙක් ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. ඕනෑම කච්චේරියක හෝ ප්‍රාදෙශීයේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ මෙම ටෙන්ඩර් ගාස්තු තැන්පත් කළ හැක. ගිවිසුම් පත්‍ර අත්සන් කළ පසු මෙම මුදල ආපසු ගෙවනු ලැබේ.

තෝරාගත් ටෙන්ඩර්කරු වෙත ටෙන්ඩරය භාරගත් බව දන්වා දින 10 ක් ඇතුළත අවශ්‍ය ඇප මුදල තැන්පත් කිරීමට හෝ ගිවිසුම් පත්‍රය අත්සන් කිරීමට හෝ නොහැකිවිණි නම්, ඔහු විසින් තැන්පත් කරන ලද ටෙන්ඩර් ගාස්තුව රාජසන්තක කරනවාත් හැර, ඔහුගේ නම රජයේ කොන්ත්‍රාත්තු පැහැර හැරියවුන්ගේ නාම ලේඛනයට ඇතුළත් කරනු ලැබේ. එහෙත් මේ නිසා ඔහුගෙන් රජයට අයවිය යුතු යම් මුදලක් වෙතොත්, එය අයකර ගැනීමට බාධාවක් නොවේ.

4. ටෙන්ඩර් පත්‍ර ලියා පදිංචි කළ තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුයි. නැතහොත් මුද්‍රා තැබූ කවරවල බහාලන ලද ටෙන්ඩර් පත්‍ර "බතලගොඩ/වාරියපොල රජයේ ගොවිපලේ ලෙලි පොල් මිළට ගැනීම සඳහා ටෙන්ඩර්" යනුවෙන් ද, ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනයද කවරයේ සඳහන් කොට "කුණ්ඩසාලේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, පාසැල් ගොවිපලේ, ගොවිපල් පාලනය හා නිෂ්පාදන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන" වෙත ටෙන්ඩර්කරු විසින් හෝ ඔහුගේ නියෝජිතයින් විසින් පුද්ගලිකව භාරදිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන දිනම, ලියා පදිංචි කළ තැපෑලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුණු බව දන්වනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දින සිට දින හතරක් ඇතුළත යම් ටෙන්ඩර්කරුවෙකුට එවැනි දැන්වීමක් නොලැබුණි නම්, ඒ බව කුණ්ඩසාලේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පාසැල් ගොවිපලේ ගොවිපල් පාලනය හා නිෂ්පාදන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත ඔහු විසින්ම වහාම දැන්විය යුතුයි.

5. කැමති නම් ටෙන්ඩර් පත්‍ර විවෘත කරන වේලාවේදී පැමිණ සිටීමට ටෙන්ඩර්කරුවන්ට අවසර ඇත. ටෙන්ඩර් පත්‍ර භාරගනු ලබන අවසාන දින එකී වේලාවට කුණ්ඩසාලේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, ගොවිපල් පාලනය හා නිෂ්පාදන කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ.

6. නියමිත පෝර්මයේ ලියා නැති. නැතහොත් එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුවී නැති කිසිම ටෙන්ඩර් පත්‍රයක්, ටෙන්ඩර් පත්‍රයක් ලෙස සලකනු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවාත් හැර ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළහොත් ඒ තැන්වල ටෙන්ඩර්කරුවාගේ කෙටි අත්සන තැබිය යුතුවේ.

7. ටෙන්ඩර්කරුගේ නම, ලිපිනය පැහැදිලි අකුරෙන් ටෙන්ඩර් පත්‍රයෙහි ලිවිය යුතුයි.

8. ටෙන්ඩර් පත්‍රිකා විවෘත කොට සති තුනක් ගතවනතුරු ටෙන්ඩර් පත්‍රිකා පිළිගැනීම සඳහා ඉඩ ඇති බව ටෙන්ඩර්කරුවන් විසින් සැලකිය යුතුයි.

9. ටෙන්ඩර් පත්‍රයේ සඳහන්වූද, පිළිගනු ලැබුවාවූද, දේවල මුළු ගණනින් සියයට පහක (5%) ඇප මුදලක් කෘෂිකර්ම අධ්‍යක්ෂ නමින් තැන්පත් කිරීමටත්, ගිවිසුම් පත්‍රයක් අත්සන් කිරීමටත්,

පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවාට නියම කරනු ලැබේ. මේ මුදල ආපසු දෙනු ලබන්නේ කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටුකර නිමවූ විට පමණි. පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවා මෙම කොන්ත්‍රාත්තුව ඉටු නොකළහොත්, ඔහුගේ ඇප මුදල රාජසන්තක වෙනවා පමණක් නොව, ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුලත් වෙනවාද ඇත.

10. ගිවිසුම් පත්‍රයට ඇලවිය යුතු මුද්දරවල වටිනාකම පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ගෙවිය යුතුයි.

11. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කරන සියළුම මිළ ගණන් ගැටත් පිරිසෙයින් සති තුනකටවත් වෙනස් නොවන ඒවා විය යුතුයි.

12. කිසියම් ටෙන්ඩර් පත්‍රිකාවක් හෝ ටෙන්ඩර් පත්‍රිකා සියල්ලම හෝ ප්‍රතික්ෂේප කිරීමේත්, කිසියම් ටෙන්ඩරයක කොටසක් පමණක් පිළිගැනීමේත් බලය කෘෂිකර්ම අධ්‍යක්ෂ සතුය.

13. පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින්, මෙම කොන්ත්‍රාත්තුව යටතේවූ වැඩ කරවා ගැනීමට, පුහුණු හා නුපුහුණු හා දෙවර්ගයේම ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්කරු එකඟ විය යුතු අතර, ඔව්හු පමණක් එස් නියුක්ත කළ යුතුයි. ඒ කම්කරුවන් හැකිතරම් දුරට බඳවා ගත යුත්තේ වැඩය කෙරෙන ප්‍රදේශයේ සිටින අය අතුරින්.

කොන්ත්‍රාත්තුවේ මේ කොන්දේසිය සපුරාලීමට කොන්ත්‍රාත්තුකරුවා යම්කිසි විදියකින් අසමත් වුවහොත්, කොන්ත්‍රාත්තුව අවලංගුවීමට එය තුඩු දෙනවා ඇත. එහෙත් කොන්ත්‍රාත්තුවට ලැබෙන ලද නිලධාරියා විසින් විශේෂ අවස්ථාවලදී කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වරයාගේ එකඟත්වය ඇතිව, නිශ්චිතව වන කම්කරුවන් නියුක්ත කරවීමට කොන්ත්‍රාත්කරුට බලය දිය හැක. එවැනි ලිඛිත බලයක් හා එකඟත්වයක් නොමැතිව ලාංකික නොවන කම්කරුවන් යෙදවීමට, තහනම් වන අතර, එය කොන්ත්‍රාත්තුව කඩකිරීමක් ලෙස සළකනු ලැබේ.

මෙම කොන්ත්‍රාත්තුවේ අභිප්‍රාය සඳහා "ලාංකික" යන්නෙන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් හෝ ලංකාවේ රටවැසියෙකු, අදහස් කෙරෙන අතර, එවැන්නෙක් එකී පාඨයට ඇතුලත් වෙයි.

මේ කොන්ත්‍රාත්තුවේ කටයුතු සඳහා යොදවනු ලබන සෑම කම්කරු කොට්ඨාශයකටම සාධාරණ වූද, කම්කරුවනට වේතන ගෙවීම සම්බන්ධයෙන් දැනට බල පවත්වන සහ මින් මතු ක්‍රියාත්මක විය හැකි සියළුම රෙගුලාසිවලට අනුකූලවූද වේතනයන් ගෙවීමට කොන්ත්‍රාත්කරු එකඟ විය යුතුයි.

කොන්ත්‍රාත්කරු විසින්, එකී වැඩ කෙරෙහි යොදවනු ලැබූ කම්කරුවන් හා සම්බන්ධ ඔහුගේ පත පොත, චෙක්රෝල් පොත්, පෙරෙව්වූ පොත් සහ අනිකුත් ලිපි ලේඛන පරීක්ෂා කර බැලීමට කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් විධිමත්ව බලය දෙනු ලැබූ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඕනෑම නිලධාරියෙකුට ඒවා පරීක්ෂා කිරීමට ඉඩ දීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටී.

14. පෞද්ගලිකව ටෙන්ඩර්කරුවෙත භාරදෙන ලද හෝ ටෙන්ඩර් පත්‍රයේ සඳහන් ලිපිනයට ලියාපදිංචි කළ තැපෑලෙන් යවන ලද හෝ ටෙන්ඩරයට අදාල සෑම දැන්වීමක්ම ටෙන්ඩර්කරු අතට පත්කළායේ සළකනු ලැබේ.

15. 1934 වර්ෂයේ අංක 19 දරණ කම්කරු ආඥාපනතේ (117 වන අධිකාරිය) යටතේ සේවයෙහි යොදන ලද කම්කරුවෙකු විසින් හෝ කම්කරුවෙකු වෙනුවෙන් ඉල්වනු ලබන වන්දියකින් කොන්ත්‍රාත්කරු විසින් රජය නිදහස් කළ යුතුයි.

16. ටෙන්ඩර්කරු විසින් වැඩට ගන්නා යම් සේවකයෙකු සේවයේ යෙදවීමට අහිතකර දෙයක් ලෙස සළකා ඊට විරෝධය දැක්වීමේත්, යම් සේවකයෙකු සේවයේ යෙදවීමට කලින් විරුද්ධවීමේත් බලය රජය සතු වන්නේය.

17. වැඩ පැහැර හරින කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ රජය මගින් තබා ඇති ලේඛණයේ තනි තනිව හෝ ලේඛණයේ නම් සඳහන් වෙනත් අයෙකුගේ නම සමඟ හෝ ඇතුළත් වී සිටින යම් පුද්ගලයෙකු සමග හෝ කෘෂිකර්ම අධ්‍යක්ෂ වරයාට හැඟී යන හේතු නිසා හෝ කොන්ත්‍රාත්තුව භාරදීම නුසුදුස්සෙකු ලෙස සලකා ඔහු විසින් විරෝධය දක්වන කිසිවෙකු සමග කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

18. මේ පිළිබඳව වැඩි විස්තර බතලගොඩ සහ වාරියපොළ රජයේ ගොවිපලවල කළමනාකරුවන්ගෙන් දැනගත හැකිය.

ජේ. යූ. නානායක්කාර,
නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (කෘෂි. ගොවිපල්),
පේරාදෙණිය.

1973. 01. 17 වන දින,
පේරාදෙණියේ දීය.

2-271—73.02.09 දින අංක 46 දරණ ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### කුණ්ඩසාලේ කුකුළු පර්යේෂණ මධ්‍යස්ථානයේ ප්‍රවාහන සේවා

යථෝක්ත ගොවිපලේ පහත සඳහන් ප්‍රවාහන සේවාවන් සඳහා සීල් තබා එවන ටෙන්ඩර් පේරාදෙණිය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සත්ව පාලන හා සෞඛ්‍ය අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1973. 03. 02 දින පස්වරු 2 දක්වා භාරගනු ලැබේ:—

කුණ්ඩසාලේ කුකුල් පර්යේෂණ මධ්‍යස්ථානයේ සිට මහනුවර දුම්රිය පලටත්, එම දුම්රිය පලේ සිට එකී පර්යේෂණ මධ්‍යස්ථානයටත් කුකුල් පැටවු හා සත්වාහාර ප්‍රවාහනය කිරීම.

2. මෙම ප්‍රවාහනයන් සඳහා යොදවනු ලබන ලොරි ආවරණය කළ ඒවා විය යුතුය.

3. පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, සත්ව පාලන හා සෞඛ්‍ය අංශයේ නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් 1973.03.01 දින දවල් 12 වන තෙක් නිකුත් කරනු ලබන ටෙන්ඩර් පෝරම ලබාගෙන නියමිත පරිදි සම්පූර්ණකර පිටපත් දෙකකින් යුතුව කවරයක බහා සීල් තබා "සභාපති, ටෙන්ඩර් මණ්ඩලය, සත්ව පාලන හා සෞඛ්‍ය අංශය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය යන ලිපිනයට ලේඛනගත තැපෑලෙන් එවිය යුතු අතර එම කවරයේ වම්පස උඩ කෙළවරේ "ප්‍රවාහන සේවා සඳහා ටෙන්ඩර්" යන්න ද ලිවිය යුතුය. ටෙන්ඩර් පෝරම නිකුත් කරනු ලබන්නේ කෘෂිකර්ම අධ්‍යක්ෂ නමින් රු. 25 ක් ඕනෑම කච්චේරියක හෝ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ නැන්පත් කර කුවිතාන්සිය ඉදිරිපත් කළ විට පමණි.

4. පිළිගනු ලැබුවා වූ ටෙන්ඩරයේ මුළු වටිනාකමින් සියයට පහක මුදලක් කෘෂිකර්ම අධ්‍යක්ෂ නමින් තැන්පත් කිරීමට ටෙන්ඩර්කරුවාට සිදුවන අතර, ගිවිසුම් පත්‍රයකට හෝ පොරොන්දු පත්‍රයකට ඔහුට බැඳීමට සිදුවනු ඇත. එසේ කිරීමට අපොහොසත් වුවහොත් ඔහුගේ කොන්ත්‍රාත්තු අවලංගු කර නම රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලැයිස්තුවට ඇතුලත් කරනු ලැබේ.

5. 1934 අංක 19 දරණ කම්කරු වන්දි ආඥාපනත (117 වන පරිච්ඡේදය) යටතේ තමාගේ කිසියම් සේවකයෙකු වෙනුවෙන් වන්දි ඉල්ලා එවන ඉල්ලුම්පත්‍ර ගැන වගකීමෙන් කොන්ත්‍රාත්කරුවා විසින් ආණ්ඩුව නිදහස් කළ යුතුය.

6. මේ සඳහා වැඩි විස්තර එකී ස්ථාන භාර නිලධාරී තැනගෙන් හෝ මගෙන් විමසන්න.

නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ,
(සත්ව පාලන හා සෞඛ්‍ය),

1973. 02. මස 19 වැනි දින,
පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ,
සත්ව පාලන හා සෞඛ්‍ය කාර්යාලයේ දී ය.

2-262—73.02.09 දින අංක 46 දරණ ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

මාතර ගොවිපල් පාලනය හා නිෂ්පාදන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් වීරපාන රජයේ ගොවිපලේ ඇති රබර් ගස් 2,000 ක් කිරි ගැනීම පිණිස බදු දීම සඳහා 1973 පෙබරවාරි මස 26 වැනි දින පස්වරු 2.30 වන තෙක් ටෙන්ඩර් කැඳවනු ලැබේ. මේ සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කරන්නවුන් පහත සඳහන් කොන්දේසි පිළිගැනීමට බැඳිසිටිය යුතු අතරම, ගොවිපල කළමනාකාර තැනගේ උපදෙස් පිළිපැදිය යුතුය.

1. රබර් ගස් 2,000 බදු දීම කරනු ලබන්නේ එක් වර්ෂයකට සීමිත වන පරිදිය.
2. කිරි ගැනීමට ගස් කැපිය යුත්තේ ගොවිපල කළමනාකරු විසින් ලකුණු කරනු ලබන පරිදිය.
3. දිනක් හැර දිනක් කිරි ගැනීම කළ යුතුය.
4. දින 30 ක් ඇතුලතදී අඟලකට වඩා කැපුමේ බෑස්සවීම නොකළ යුතුය.
5. කිරි ගැනීමේදී කිසිදු ගසකට හානි නොවන පරිදි ක්‍රියා කළ යුතුය.
6. රබර් කිරි ගැනීමට අවශ්‍ය පොල්කටු හා රබර් පිලි පිළිගත් ටෙන්ඩර්කරු විසින් සපයා ගත යුතුයි.

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### බදුල්ල සෞඛ්‍ය සේවා අධිකාරී කොට්ඨාශය

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයන් හා සේවා.**—වර්ෂ 1973 මාර්තු 1 වැනිදා සිට 1973 දෙසැම්බර් 31 වැනිදා දක්වා (දින දෙකම ඇතුළත්ව) කාලය තුළ මේ සමග ඇති උපලේඛනයෙහි පළමුවන තීරයේ සඳහන් වන ආයතනයන්ට කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම සඳහා ලාංකිකයන් ගෙන් හෝ ලාංකික සමාගම් විසින් එවනු ලබන සිල් තබන ලද ටෙන්ඩර් පත්‍ර බදුල්ලේ පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලයේදී සෞඛ්‍ය සේවා අධිකාරී විසින් භාරගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙහි උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුය. අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් සහ විවිධ සේවා සංගම්වලට අයිති සමිතිවලට ද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වේවා, එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියා පදිංචි අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වන තුරු, මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුර, මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, මහනුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුර සහ වවුනියාව යන පළාත්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ගේ කාර්යාලවලින් ලබාගත හැක. නියමිත ආකෘති පත්‍රයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලුම් කිරීමේ දී මුදල් තැන්පත් කළ බවට සාක්ෂි වශයෙන් නිකුත් කරන ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුය. ටෙන්ඩර් කරුවන්ට ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබාගෙන ඒවා අවසාන දිනයට පළමු ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි, ආකෘති පත්‍ර සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත් කල්වේලා ඇතිව එවිය යුතුය.

3. **වත්කමේ විස්තර.**—සියලුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් ආකෘති පත්‍ර සඳහා ඉල්ලුම් කිරීමේ දී ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට සැලකිය යුතු කාලයකට පෙර තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් පත්‍ර ලබා ගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දැන්විය යුතුයි. මේ සඳහා උවමනා ආකෘති පත්‍ර ඉහත පෙනෙන දෙවන ඡෙදයේ (ii) කොටසෙහි සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැකි. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දැන් වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමිවන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දැන ගැනීමට මේ සමඟ ඇති උපලේඛනයෙහි 5 වන තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියලුම ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුතුව කවරයක බහා "සෞඛ්‍ය සේවා අධිකාරී, බදුල්ල" කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම් පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහා දැයි පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම එහි වම් පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිළිව සඳහන් කළ යුතුයි. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලියාපදිංචි කළ තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක. ටෙන්ඩර් පත්‍රිකා පුද්ගලිකව මට හෝ ගණකාධිකාරී/ලේකම් ට භාරදෙන්නේ නම් ටෙන්ඩර් පත්‍රිකා ලැබුන බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුය.

6. **ටෙන්ඩර් පත් භාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වැනි තීරයේ සඳහන් දිනයන්හි පෙ.ව. 10 ට ටෙන්ඩර් පත්‍ර භාරගැනීම අවසන් වූ වහාම ඒවා මෙම කාර්යාලයේදී විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩරයන්හි තීරණය.**—ටෙන්ඩර් පත් තෝරා ගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර්කරු විසින් පෝරමයේ "බී" උපලේඛනයෙහි සඳහන් ආහාර සැපයීම සඳහා බලාපොරොත්තු වන මිළ ගණන් අනුව ඒ සඳහා වියදම් වන මුළු මුදල අනුවය. එසේ වුවහොත් ටෙන්ඩර් පෝරමයෙහි "සී" උපලේඛනයට අයත් වැඩිපුර ද්‍රව්‍ය සඳහා අය කිරීමට අදහස් කරන මිළ ගණන් සඳහන් කළ යුතුයි. එහෙත් ඒ සඳහා මුදල් ගෙවීම කරන විට ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් හෝ එවකට වෙළඳ පොලේ පවතින මිළ ගණන් හෝ යන දෙකින් අඩු ගණන ගෙවනු ලැබේ. පාලන මිලක් පවතීනම්, එම පාලන මිළ ගණන් අනුව ගෙවීම කරනු ලැබේ.

8. **ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීම.**—ටෙන්ඩර් පත්‍ර විවෘත කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැකි ය. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද, පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇතිවුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමඟ කලින් පිළියෙළ කරගත් දිනයක මවිසින් හෝ බලය පවරනු ලැබූ මාගේ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

9. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡෙදයේ සඳහන් කාලසීමාව ඉකුත් වනතුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂයෙන් සඳහන් කර නැති නම් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසාවත් එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

10. **තැන්පත් ඇප මුදල.**—තෝරාගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙයේ 3 වැනි තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

11. **බඩු බාහිරාදිය තබා ගැනීම.**—තෝරාගත් ටෙන්ඩර්කරුවන්ගේ බඩුබාහිරාදිය ගබඩා කර තබා ගැනීම සඳහා ආයතනයේ හෝ එහි පිහිටි ඉඩම් තුළ ඉඩකඩ සලසා දෙනු නොලැබේ.

12. **ටෙනඩර් පිළිබඳ කොන්දේසි.**—(i) ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවන් වීමට බලාපොරොත්තුවන්නන්, එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් මෙන් ම, පිළිපැදිය යුතු ද වන්නේය. ටෙන්ඩර් පත්‍රයෙහි තිබෙන ගිවිසුමේ කොන්දේසි ද ටෙන්ඩර්කරුවන් විසින් සැලකිය යුතුය.

(ii) රෝගියෙකුගේ සම්පූර්ණ ආහාර වේලකට සහල් අවුන්ස 3½ක් ඇතුලත් වනසේ බත් වේල් සැපයීමට ටෙන්ඩර්කරුවන් මිල ගණන් දැක්විය යුතුය.

(iii) දැනට ආහාර උපලේඛනයේ දකිවා ඇති සහල් අවුන්ස 12 ප්‍රමාණය අවුන්ස 9 වශයෙන් වෙනස්කර ඇති නිසා, ඒ වෙනුවෙන් අමතරව පාන් සැපයීම අනවශ්‍ය වනු ඇත.

(iv) අවශ්‍ය සහල් ආහාර කොමසාරිස් විසින් සලාක නොවන මිලට සපයන අතර ඒ සඳහා ටෙන්ඩර්කරු මුදල් ගෙවිය යුතුය.

පරිත්‍යාග කරන ලද සහල් හෝ නොමිලයේ සහල් හෝ පිසීම සඳහා කොන්ත්‍රාත්කරුට සැපයුවහොත් ඒ සඳහා සලාක නොවන සහල් මිළට කොන්ත්‍රාත් කරුගේ ආහාර වවුචරයෙන් මුදල් අඩුකරනු ලැබේ.

කිසියම් අවස්ථාවක දී සලාක සහල් සැපයුවහොත් ඒ සහල් සඳහා සලාක මිලට කොන්ත්‍රාත් කරු විසින් මුදල් ගෙවිය යුතුය. ඒ අතර සලාක නොවන සහල් මිලේ සහ සලාක සහල් මිලේ වෙනස කොන්ත්‍රාත්කරුගේ ආහාර වවුචරයෙන් අඩුකරගනු ලැබේ.

(v) කූපන් භාර නුදුනුහොත් සේවකයන්ට සැපයිය යුත්තේ පාන් ය. කූපන් භාර දුනහොත් ඒ වෙනුවෙන් නොසපයනු ලබන පාන් සඳහා පහත සඳහන් පරිදි කොන්ත්‍රාත්කරුගේ වවුචරයෙන් මුදල් අඩුකරනු ලැබේ :—

(අ) කූපන්වලට ලබා ගන්නා සහල් දැනට මෙන් නොමිලයේ වුවහොත් නොසපයනු ලබන පාන්වල සම්පූර්ණ වටිනාකම අඩුකරනු ලැබේ.

(ආ) එවැනි කූපන්වලට සහල් නිකුත් කරන්නේ කොන්ත්‍රාත්කරු ගෙවන සලාක මිලට නම් නොසපයනු ලබන පාන්වල මිළේත් සලාක සහල් මිළේත් වෙනස අඩුකරගනු ලැබේ.

ඩී. ඩබ්. කේ. හීන්දෙනිය,
බදුල්ල සෞඛ්‍ය සේවා අධිකාරී.

සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලය,
බදුල්ල,
1973 ජනවාරි 26 වැනි දින දීය.

### උපලේඛනය—1973

| (1) ආයතනය | (2) ටෙන්ඩර් සඳහා කැප්පත් මුදල | (3) ඇප මුදල | (4) ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය හා වේලාව | (5) ආහාර ප්‍රමාණය දළ වශයෙන් — සේවකයන්ට: මාළු | සේවකයන්ට: බිත්තර | සේවකයන්ට: මස් | සේවකයන්ට: කරවල | සේවකයන්ට: එළවළු | නොගෙවන රෝගීන්ට: මාළු | නොගෙවන රෝගීන්ට: බිත්තර | නොගෙවන රෝගීන්ට: මස් | නොගෙවන රෝගීන්ට: කරවල | නොගෙවන රෝගීන්ට: එළවළු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | | | | | | | | | | | |
| 1. හල්දුම්මුල්ල ප.ඒ. | 100... | 400 | 73.2.21 පෙරවරු 10.00 ට | 200... | 200... | 200... | 200... | 600... | 600... | 600... | 600... | 600... | 2,000 |
| 2. බිබිලේගම මා.නි. ... | 100... | 600 | | 200... | 200... | 200... | 200... | 800... | 200... | 200... | 200... | 200... | 700 |
| 3. හිඟුරැකඩුව මා.නි. ... | 100... | 400 | | 160... | 160... | 160... | 160... | 700... | 80... | 70... | 70... | 70... | 280 |

2–280—73.02.09 දින අංක 46 දරණ ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### රජයේ ගොවිපළවල ගොයම් කැපීම, ප්‍රවාහනය කිරීම, එක්රැස්කිරීම සඳහා ටෙන්ඩර්

පහත සඳහන් ගොවිපළවල ගොයම් කැපීම, ප්‍රවාහනය කිරීම හා එක්රැස්කිරීම සම්බන්ධයෙන් 1973.2.14 දින පෙ.ව. 10 දක්වා යාපනය කෘෂිකර්ම කාර්යාලයේ කෘෂිකර්ම නිලධාරි (ගොවිපළ පාලන හා නිෂ්පාදන) විසින් සීල් තබන ලද ටෙන්ඩර් පත්‍රිකා භාරගනු ලැබේ.

| කට්ටි අංකය | ගොයම් කැපීම අරඹන දිනය | වර්ගය | ගොයම් කැපිය යුතු සම්පූර්ණ අක්කර ගණන | දිනකට කළයුතු අක්කර ප්‍රමාණය | කැපීම් නිමකළයුතු අවසාන දිනය |
|---|---|---|---|---|---|
| **කරදියන්ආරු ගොවිපළ** | | | | | |
| 1 | 1973.03.01 | බීජී 11–11 | අක්කර 15 | අක්කර 5 | 1973.03.03 |
| 2 | 1973.03.05 | බීජී 11–11 | ,, 6 | ,, 3 | 1973.03.06 |
| 3 | 1973.03.07 | බීජී 11–11 | ,, 13 | ,, 3 | 1973.03.10 |
| 4 | 1973.03.11 | එල්ඩී 66 | ,, 10 | ,, 3 | 1973.03.13 |
| 5 | 1973.02.18 | බීජී 34–8 | ,, 12 | ,, 3 | 1973.02.22 |
| **කිලිනොච්චි ගොවිපළ** | | | | | |
| 1 | 1973.02.22 | බීජී 11–11 | ,, 10 | ,, 5 | 1973.02.23 |
| | 1973.02.24 | — | — | ,, 5 | 1973.02.25 |
| 2 | 1973.02.26 | එල්ඩී 66 | ,, 21 | ,, 5 | 1973.02.27 |
| | 1973.02.28 | — | — | ,, 5 | 1973.03.01 |
| | 1973.03.02 | — | — | ,, 5 | 1973.03.03 |
| | 1973.03.16 | — | — | ,, 6 | 1973.03.18 |
| 3 | 1973.03.04 | බීජී 34–8 | ,, 25 | ,, 5 | 1973.03.05 |
| | 1973.03.06 | — | — | ,, 5 | 1973.03.07 |
| | 1973.03.08 | — | — | ,, 5 | 1973.03.09 |
| | 1973.03.10 | — | — | ,, 5 | 1973.03.11 |
| | 1973.03.12 | — | — | ,, 5 | 1973.03.13 |
| **වවුනියා ගොවිපළ** | | | | | |
| ඩී | 1973.02.15 | බීජී 34–6 | ,, 09 | ,, 2 | 1973.02.19 |
| බී 2 | 1973.02.20 | බීජී 34–8 | ,, 07 | ,, 2 | 1973.02.23 |
| බී 1 | 1973.03.06 | බීජී 11–11 | ,, 10 | ,, 2 | 1973.03.10 |
| ඒ | 1973.03.30 | එච්—4 | ,, 09 | ,, 2 | 1973.04.03 |
| **මුරුන්කන් ගොවිපල** | | | | | |
| 1 | 1973.02.17 | අයිආර් 20 | ,, 05 | ,, 4 | 1973.02.19 |
| 2 | 1973.02.20 | අයිආර් 8 | ,, 05 | ,, 4 | 1973.02.22 |
| 3 | 1973.02.23 | බීජී 11–11 | ,, 20 | ,, 4 | 1973.02.28 |
| 4 | 1973.03.03 | බීජී 11–11 | ,, 15 | ,, 4 | 1973.03.08 |
| 5 | 1973.03.12 | බීජී 11–11 | ,, 10 | ,, 4 | 1973.03 15 |
| 6 | 1973.03.06 | බීජී 34–8 | ,, 15 | ,, 4 | 1973.03.10 |

එක්රැස් කිරීම කළයුතු වන්නේ ගොවිපළ කළමනාකාර තැන හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් නියම කරන ස්ථානයකය. කොයියම් අවස්ථාවක හෝ අස්වැන්නට අලාභ හානියක් සිදුනොවිය යුතුය. කුඹුරුවල ගොයම් කැපීමෙන් පසු ඉපනැලි අඟල් 6''කට වැඩියෙන් උසට නොතැබිය යුතුය.

අස්වැන්න එකතු කිරීම නියමිත කාලය තුළ නිමකළ යුතු අතර, අවසාන දිනයෙන් පසු ප්‍රමාදවන සෑම දිනයක් සඳහා ම දිනකට, එකී අස්වැන්නෙහි අලාභය හා සමාන වූ දඩ මුදලක් බැගින් කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගනු ඇත. (අලාභ හානිය ගණන් ගනු ලබන්නේ අවසාන දිනයෙන් පසු ප්‍රමාද වන සෑම දිනයක් පාසාම රු. 25 බැගිනි). කුඹුරු වැඩ මෙහෙයුම් සියල්ලක්ම ගොවිපළ කළමනාකාර තැන සෑහීමකට පත්වන පරිදි ඉටු කළ යුතුය. දිනකට අඩුවශයෙන් අක්කර 4 ක වත් ගොයම් කැපිය යුතුය. කපන ලද ගොයම් කොළ ගොඩ ගැසීම කොතැනක කළ යුත්තේ දැයි කළමනාකාර තැන තීරණය කරනු ඇත. කොන්ත්‍රාත්කරුගේ පැහැර හැරීමෙන් හෝ නොසැලකිල්ලෙන් අස්වැන්නට යම් අලාභ හානියක් සිදුවුවහොත් එකී වටිනාකම ඔහුගෙන් අයකර ගනු ඇත.

කොන්ත්‍රාත් මිළ ගණන් පිළිබඳ විස්තර, එක් එක් වර්ගය සම්බන්ධයෙන් හා එයද අක්කර පදනමක් මත විය යුතු අතර, එකී සම්පූර්ණ අක්කර ප්‍රමාණය හෝ ඉන් කොටසක් භාරගැනීමට තෝරා පත්කර ගනු ලබන ටෙන්ඩර්කරු සූදානම් විය යුතුය. මෙම කුඹුරුවැඩ ගොවිපළ කළමනාකාර තැන හෝ ඔහුගේ නියෝජිතයා විසින් නියම කරන පරිදි හා ඔවුන් විසින් නියම කරන දිනට අවසන් කළ යුතු වන්නේය.

2\. ඉහත සඳහන් එක් එක් ස්ථානයේ එකී සේවාවන් සඳහා වෙන වෙනම ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුතු අතර එක් එක් ටෙන්ඩර් පත්‍රය උදෙසා රුපියල් 25/- බැගින් ටෙන්ඩර් ගාස්තු තැන්පත් කළ යුතු වේ.

3\. යාපනයේ කෘෂිකර්ම කාර්යාලයේ කෘෂිකර්ම නිළධාරි (ගො.පා.භානි.) ගෙන් ලබාගත් ආකෘති පත්‍රවල ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුතුයි. සියළුම ටෙන්ඩර් පත්‍ර දෙපිට පතකින් අත්සන් තබා මුද්‍රා තබන ලද කවරවල බහා එවිය යුතුයි. කවරයේ ඉහළ වම් කෙළවරේ (ස්ථානයේ නම සහ සේවාව සඳහන් කරන්න) සඳහා ටෙන්ඩර් පත්‍රයයි, යනුවෙන් සඳහන් කොට යාපනයේ කෘෂිකර්ම කාර්යාලයේ කෘෂිකර්ම නිලධාරි (ගො.පා.භානි.) වෙත ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කළ තැපෑලෙන් නොඑවන්නේ නම් සීල් තබන ලද කවරවල බහා ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයා විසින් යාපනයේ කෘෂිකර්ම නිලධාරි කාර්යාලයේ (ගො.පා.භා.නි.) ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය යුතුයි. ටෙන්ඩර් පත්‍රිකා විවෘත කළ පසු ලියාපදිංචි කළ තැපෑලෙන් ටෙන්ඩර් පත්‍රිකා එවන ලද ටෙන්ඩර් කරුවන් වෙත එම ටෙන්ඩර් පත්‍රිකා ලැබුණු බව දන්වා එවනු ලැබේ. ටෙන්ඩර් පත්‍රිකා භාරගන්නා අවසාන දින වශයෙන් සඳහන් දින සිට දින හතරක් ඇතුළත ටෙන්ඩර් පත්‍රය ලැබුණු බවට එවැනි ලිපියක් කිසියම් ටෙන්ඩර් කරුවෙකුට නොලැබුණි නම්, ඔහු විසින් යාපනයේ කෘෂිකර්ම නිලධාරි (ගො.පා.භානි.) වෙත ඒ බව නොපමාව දන්විය යුතුය.

4. ටෙන්ඩරයකට රුපියල් ...... බැගින් මුදල් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් පත්‍ර භාරගන්න අවසාන දිනට පෙර දින දහවල් 12 වනතෙක් ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. මෙම තැන්පත් මුදල් කැමති කච්චේරියක හෝ පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මූලස්ථානයේ හෝ තැන්පත් කළ හැකිය. ගිවිසුම් පත්‍රය අත්සන් කළ පසු මේ තැන්පත් මුදල ආපසු ගෙවනු ලැබේ. ටෙන්ඩර් පත්‍රය පිළිගන්නා ලද බව දන්වූ දින සිට දින දහයක් ඇතුළත ගිවිසුම් පත්‍රයට අත්සන් තැබීමට පිළිගත් ටෙන්ඩර්කරු අපොහොසත් වුවහොත්, ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වනවාත් හැර ඔහුගේ නම වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ නාම ලේඛණයට ඇතුළත් කිරීමටද හේතුවේ. එහෙත් එයින් රජයට ඔහුගෙන් අයවිය යුතු වෙනත් මුදලක් ඇතොත් එම අයකර ගැනීම්වලට බාධාවක් ඇති නොවේ. ගොවිපල කළමනාකරු විසින් නියම කරන ලද දිනයක වැඩ ආරම්භ කර අදාල දිනයට වැඩය නිමකර දිය යුතුයි. එසේ නොකරන්නාවූ ටෙන්ඩර්කරුවන්ට ගිවිසුම් පත්‍රයෙහි සඳහන් වන අලාභය ගෙවීමටද සිදුවේ.

5. ටෙන්ඩර්කරුගේ අභිමතය පරිදි අවශ්‍ය නම් ටෙන්ඩර් පත්‍රිකා විවෘත කරන විට පැමිණ සිටීමට ඔවුන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් පත්‍රිකා භාර ගන්නා අවසාන දින වශයෙන් ඉහතින් දක්වා ඇති දින එකී වේලාවට යාපනයේ කෘෂිකර්ම නිලධාරි (ගො.පා.හා.නි.) තැනගේ කාර්‍යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ.

6. පිළිගත් පෝර්මයෙහි (දෙසිටපතින් යුතුව) ඉදිරිපත් නොකරන ලද හෝ එහි සඳහන් කොන්දේසිවලට සම්පූර්ණයෙන්ම එකඟ නොවන්නාවූ කිසිම ටෙන්ඩර් පත්‍රයක් පිළිගනු නොලැබේ. ටෙන්ඩර් ගාස්තු ප්‍රමාණ හා මිළ ගණන් තීන්තෙන් පැහැදිලි ලෙස සටහන් කළ යුතු අතර, සියළුම වෙනස් කිරීම්වලට ටෙන්ඩර්කරුගේ අත්සන යොද සහතික කළ යුතුවේ.

7. ටෙන්ඩර්කරුවන් විසින් තමන්ගේ නම සහ ලිපිනයන් සම්පූර්ණ ලෙස පැහැදිලි අකුරින් සටහන්කර තිබිය යුතුය.

8. පිළිගත් ටෙන්ඩර්කරුට ගිවිසුමකට එළඹීමට සිදුවන අතරම ටෙන්ඩර් කරන ලදුව පිළිගනු ලැබුවාවූ වැඩ කොටස්වල මුලු වටිනාකමින් 5%ක මුදලක් කෘෂිකර්ම අධ්‍යක්ෂ නමින් තැන්පත් කිරීමට සිදුවේ. මෙම මුදල ආපසු ගෙවනු ලබන්නේ කොන්ත්‍රාත්තුව සාර්ථක ලෙස ඉටුකළ පසුය. පිළිගත් ටෙන්ඩර්කරුට කොන්ත්‍රාත්තුව ඉටු කිරීමට නොහැකි වුවහොත් ඔහුගේ තැන්පත් මුදල රාජසන්තක කර, රජය මගින් තබා ඇති වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛණයෙහි එම ටෙන්ඩර්කරුගේ නමද ඇතුළත් කරනවා ඇත.

9. ගිවිසුම් පත්‍රයට අලවන මුද්දර සඳහා තම අතින් වියදම් කිරීමට පිළිගත් ටෙන්ඩර්කරුට සිදුවේ.

10. අසතුටුදයක වැඩ කටයුතු නිසා හෝ කොන්ත්‍රාත්තුවේ සඳහන් නියමයන් ඉටු නොකිරීම නිසා හෝ කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමේ අයිතියද කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා සතුවන්නේය. එවැනි අවස්ථාවකදී කොන්ත්‍රාත්කරුගේ වියදමින් එම වැඩ සම්පූර්ණකර ගැනීම සඳහා වෙනත් විධි විධාන යොද ගැනීමේ අයිතියද කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා සතු වන්නේය.

11. ඕනෑම ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩර් ප්‍රතික්ෂේප කිරීමේ, ටෙන්ඩරයක හෝ ටෙන්ඩර්වල කොටසක් පමණක් පිළිගැනීමේ අයිතිය රජය සතුවේ.

12. ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දින සිට සති තුනක් තුළ භාරගැනීම සඳහා තම ටෙන්ඩර් පත්‍ර විවෘතව තැබීමට ටෙන්ඩර්කරුවන්ට සිදුවේ.

13. මේ කොන්ත්‍රාත්තුව යටතේ වූ වැඩ කරවා ගැනීමට පුහුණු හා නුපුහුණු දෙවර්ගයේම ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්කරු මෙයින් එකඟවෙන අතර ඔවුහු පමණක් එසේ නියුක්ත කරනු ලබන්නාහ. ඒ කම්කරුවන් හැකි තරම් දුරට බඳවා ගනු ලබන්නේ වැඩය කෙරෙන ප්‍රදේශයේ සිටින අයගෙනි.

කොන්ත්‍රාත්තුවේ මේ කොන්දේසි සපුරාලීමට කොන්ත්‍රාත්කරුවා යම්කිසි විධියකින් අසමත් වුවහොත් කොන්ත්‍රාත්තුව අවලංගු වීමට එය තුඩු දෙනවා ඇත. එහෙත් කොන්ත්‍රාත්තුවට එළඹෙන ලද නිලධාරියා විසින් විශේෂ අවස්ථාවලදී කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයාගේ එකඟත්වය ඇතිව නිශ්චිතව ලියවිල්ලකින් එකී නිලධාරියා විසින් අනුමත කරන ලද ලාංකික නොවන කම්කරුවන් නියුක්ත කරවීමට කොන්ත්‍රාත්කරුට බලය දිය හැක.

එවැනි ලිඛිත බලයක් හා එකඟත්වයක් නොමැතිව ලාංකික නොවන කම්කරුවන් යෙදවීම තහනම් වන අතරම එය කොන්ත්‍රාත්තුව කඩ කිරීමක් ලෙස සළකනු ලැබේ. මේ කොන්ත්‍රාත්තුවේ අභිප්‍රාය සඳහා " ලාංකික " යන්නෙන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් හෝ ලංකාවේ රටවැසි යන බව අදහස් කෙරෙන අතර, එවැන්නෙක් එකී පාඨයට ඇතුළත් වෙයි.

මේ කොන්ත්‍රාත්තුවේ කටයුතු සඳහා යොදවනු ලබන සෑම කම්කරු කොට්ඨාශයකටම සාධාරණ වූද, කම්කරුවන්ට වේතන ගෙවීම සම්බන්ධයෙන් දනට බලපවත්වන සහ මින් මතු ක්‍රියාත්මක විය හැකි සියළුම රෙගුලාසිවලට අනුකූලවූද, වේතනයක් ගෙවීමට කොන්ත්‍රාත්කරු මෙයින් එකඟ වෙයි.

කොන්ත්‍රාත්කරු කෙරෙහි එකී වැඩ කෙරෙහි යොදවනු ලැබූ කම්කරුවන් හා සම්බන්ධ ඔහුගේ පතපොත, චැක්රෝල් පොත්, පෙරෙට්ටු පොත් සහ අනිකුත් ලිපි ලේඛණ පරීක්ෂා කර බැලීමට කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් බලය දෙනු ලැබූ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඕනෑම නිලධාරියකුට ඒවා පරීක්ෂා කර බැලීමට ඉඩ දීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටී.

14. කොන්ත්‍රාත්කරුට භාරදිය යුතු සියළුම දන්වීම් ඔහුගේ අතට දුනහොත් හෝ ඔහු විසින් සඳහන් කර ඇති ලිපිනයකට තැපෑලෙන් යැව්වහොත් හෝ ඔහු අතටම භාර දුන්නා සේ සළකනු ලැබේ.

15. කොන්ත්‍රාත්කරුවෙකු විසින් සේවයේ යොදවන කම්කරුවෙකු විසින් වර්ෂ 1934 අංක 19 වෙනි කම්කරු වන්දි ආඥපනතෙහි (117 වෙනි අධිකාරය යටතේ) ඉල්ලනු ලබන වන්දියකින් රජය නිදහස් කිරීමට කොන්ත්‍රාත්කරුට සිදුවේ.

16. කිසියම් සේවකයෙකු සේවයේ යෙදීමට අහිතකර යයි රජය සළකනු ලබන විටක හා කිසියම් සේවකයෙකු කොන්ත්‍රාත්කරු විසින් සේවයට ගැනීමට විරුද්ධවීමේ අයිතිය රජය සතුවේ.

17. තනි වශයෙන් හෝ වෙනත් අයෙකුගේ නමත් සමග රජයේ කොන්ත්‍රාත්තු පැහැර හරින ලද කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛණයෙහි නම සඳහන් කිසිවෙකු සමඟ හෝ තමාට සැහේයයි හැඟි යන කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා විරුද්ධවන හෝ කිසිවෙකු සමග කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

18. එහි එකී ගොවිපළවල කළමනාකරුවන්ගෙන් මේ සම්බන්ධ වැඩි විස්තර ලබාගත හැක.

එච්. ඊ. නානායක්කාර,
නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ,
(කෘෂිකර්ම අධ්‍යාපන හා ගොවිපල).

2–265—73.02.09 දින අංක 46 දරණ ගැසට් පත්‍රය

---

**ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව**

ඇනුරුම් කටයුතු සඳහා ගිස් ලැලි පෙට්ටි සැපයීම

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ඉහත සඳහන් දේ සැපයීම සඳහා ටෙන්ඩර්පත් භාරගනු ලැබේ.

ආපසු ලබා ගත හැකි රු. 100 ක තැන්පත් මුදලක් ගෙවාලීමෙන් පසු ගබඩා හා සැපයීම් කළමනාකාරතැනගේ කාර්යාලයෙන් ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ලබාගත හැක.

1973 පෙබරවාරි මස 22 වෙනි දින පෙරවරු 10 තෙක් ටෙන්ඩර්පත් භාරගනු ලැබේ.

ගබඩා සහ සැපයීම් කළමනාකාර තැන.

113, ගාලු පාර,
කොළඹ 3.

2–328/1—73.02.09 දින අංක 46 දරණ ගැසට් පත්‍රය

## ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

පාස් සනලද ලම්බංකාර වානේ මෙට්රික් ටොන් 750 ක් ගබඩා කිරීමේ ටැංකියක් ඉදිකිරීම සහ මෝදර පිහිටි ටැංකි නිමාවට තාප්පයක් තැනීම සඳහා ටෙන්ඩර් පත්

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ඉහත සඳහන් සේවාව සඳහා ටෙන්ඩර්පත් භාරගනු ලැබේ.

ආපසු ලබා ගත හැකි රු. 100ක තැන්පත් මුදලක් ගෙවීමෙන් පසු ගබඩා සහ සැපයීම් කළමනාකාර තැනගේ කාර්යාලයෙන් ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ලබාගත හැක.

1973 පෙබරවාරි මස 22 වෙනි දින පෙරවරු 10 තෙක් ටෙන්ඩර්පත් භාරගනු ලැබේ.

ගබඩා සහ සැපයීම් කළමනාකාර තැන.

113, ගාලු පාර,
කොළඹ 3.

2–328/2—73.02.09 දින අංක 46 දරණ ගැසට් පත්‍රය

---

## රාජ්‍ය දැව සංස්ථාව

මහනුවර, රත්නපුරය හා මාතර ප්‍රදේශවලින් දැව සැපයීම සඳහා ටෙන්ඩර් කැඳවීම

පහත දැක්වෙන ප්‍රදේශයන්ගෙන් දැව සැපයීම සඳහා කොළඹ 5, වජිර පටුමග අංක 7 දරණ ස්ථානයේ රාජ්‍ය දැව සංස්ථාවේ ක්‍රියාකාරී අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් කැඳවනු ලැබේ.

2. **ටෙන්ඩර් කිරීමට සුදුස්සෝ.**—මෙම සංස්ථාවේ 1 පෙළ කොන්ත්‍රාත්කරුවන් හා රු. 1,00,000 වටිනාකම දැක්වෙන පොදු ආකෘති 170 හි වත්කම් සහතිකයක් ඉදිරිපත් කළහැකි අය.

3. **මහනුවර ප්‍රදේශය.**—පිදීඇල්ල වැඩබිමින් රු. 1,50,000 වටිනාකමට කඳන්, සිල්පර හා ඉරූ ලී ආදිය සැපයීම හා අනවශ්‍ය දැව ටෙන්ඩර් දැන්වීමේ විග්‍රහකර ඇති මිළ ගණන් යටතේ අනවශ්‍ය දැව මිළදී ගැනීම.

4. පහත දැක්වෙන එක් එක් ප්‍රදේශයන්ගෙන් රු. 1,00,000 වටිනාකමට කඳන් හා සිල්පර සැපයීම සඳහා :—

(1) **රත්නපුර ප්‍රදේශය :**

(අ) බෙරගල ර. අ. කැ.
(ආ) වලන්කන්ද රක්ෂිත වනය.

(2) **මාතර ප්‍රදේශය :**

(අ) මූලටියන අංක 1.
(ආ) මූලටියන අංක 15.
(ඇ) රම්මලේකන්ද රක්ෂිතය.

(3) **මහනුවර ප්‍රදේශය :**

(අ) අග්‍රබෝපත් යෝජිත රක්ෂිතය.

5. 1973.02.26 දින අ. භා. 2 දක්වා ටෙන්ඩර් ආකෘතිපත්‍ර නිකුත් කරනු ඇත.

6. 1973.02.27 දින පූ. භා. 11 ටෙන්ඩර් පත්‍ර භාරගැනීම අවසන් කරනු ඇත.

7. වැඩි විස්තර රාජ්‍ය දැව සංස්ථාවේ ඒ ඒ ප්‍රාදේශීය කළමනාකාරවරුන්ගෙන් හෝ කොළඹ 5, වජිර පටුමග අංක 7 දරණ ස්ථානයේ ක්‍රියාකාරී කළමනාකරුගෙන් හෝ ලබාගත හැකිය.

සභාපති,
රාජ්‍ය දැව සංස්ථාව.

රාජ්‍ය දැව සංස්ථාව,
ක්‍රියාකාරී අංශය,
7, වජිර පටුමග, කොළඹ 5.

2–329—73.02.09 දින අංක 46 දරණ ගැසට් පත්‍රය

---

**1972–73 මුදල් වර්ෂය තුල කොළඹ (වැලිකඩ, කොළඹ රිමාන්ඩ සහ මැගසින් බන්ධනාගාර) සහ මහර, බන්ධනාගාරවලට කෑම ද්‍රව්‍ය සැපයීම**

ඉහත සඳහන් බන්ධනාගාරවලට, 1973 මාර්තු 1 වෙනි දින සිට 1973 දෙසැම්බර් 31 වෙනි දින දක්වා කෑම ද්‍රව්‍ය සැපයීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබේ.

2. ටෙන්ඩර්කරුවන් මිළ ගණන් ඉදිරිපත් කළ යුත්තේ, ''වෙළඳ ද්‍රව්‍ය'' වශයෙන් මිස ''ආහාර'' ක්‍රමයට නොවේ. ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට කැමති යම් උපලේඛනයට හෝ උපලේඛනයන්හි ඉහත සඳහන් සියලුම විෂයයන් සඳහා මිළ ගණන් ඉදිරිපත් කළ යුතුය. පහත සඳහන් උපලේඛනයන්ගෙන් ඕනෑම එකකට හෝ වැඩි ගණනකට මිළ ගණන් ඉදිරිපත් කිරීමට පුළුවන. ඒ ඒ උපලේඛනය වෙනුවෙන් වෙන වෙනම ටෙන්ඩර් භාරගැනීමේ අයිතිය ටෙන්ඩර් මණ්ඩලය සතුය. සැපයිය යුතු ද්‍රව්‍ය පහත එන උපලේඛනයන්ගෙන් බලා ගත යුතුයි :—

| උපලේඛනය (ඇ) | උපලේඛනය (ඊ) |
|---|---|
| පොල්, කැඹිලි | (අ) කොළ එළවළු |
| | (ආ) පළතුරු එළවළු |
| | (ඇ) පිටි සහිත එළවලු |
| | (ඈ) අන්‍ය එළවලු |

3. සියළුම ටෙන්ඩර්පත්‍ර අනුපිටපතක් සහිතව ලියුම් කවරයක දමා සීල් තබා ''සභාපති, ටෙන්ඩර් මණ්ඩලය, බන්ධනාගාරදෙපාර්තමේන්තුව'' කියා එවිය යුතුයි.

එක ටෙන්ඩර් පෝර්මයක සඳහන් කළ යුත්තේ එක උපලේඛනයක් සඳහා මිළ ගණන් පමණකි.

4. ටෙන්ඩර් පත්‍ර රෙජිස්ටර් තැපෑලෙන් එවිය යුතුය. රෙජිස්ටර් තැපෑලෙන් නොඑවන ටෙන්ඩර්පත්‍ර ටෙන්ඩර්කරුවා විසින් හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් හෝ, කොළඹ බන්ධනාගාර මූලස්ථානයේ මූලස්ථාන අධිකාරි ජේ. පී. දෙල්ගොඩ මහතාට භාර දී එය ලැබුණු බවට ලියවිල්ලක් ලබා ගත යුතුයි.

5. ටෙන්ඩර්පත්‍ර බහා ලූ කවරයේ වම් පැත්තේ උඩ කෙළවරේ ''....................බන්ධනාගාරය....................උපලේඛනයේ සඳහන් බඩු සැපයීමේ ටෙන්ඩරය '' කියා ලියා මෙහි 9 වැනි වගන්තියේ සඳහන් දින පෙරවරු 10.30 ට ප්‍රථම බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමාට ලැබෙන සේ එවිය යුතුයි. ටෙන්ඩර්කරුවනට වුවමනා නම් ටෙන්ඩර් පත්‍ර විවෘත කරන වේලාවේ දී ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ. මෙහි 9 වැනි වගන්තියේ සඳහන් ඒ ඒ දිනවල පෙරවරු 10.35 ට කොළඹ, බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමාගේ කාර්යාලයේ දී ඒවා විවෘත කරනු ලැබේ.

6. ටෙන්ඩර් පෝර්ම කොළඹ 9, බේස්ලයින් පාරේ පිහිටි බන්ධනාගාර කොමසාරිස් තැනගේ ප්‍රධාන කාර්යාලයෙන් ලබා ගත හැක. නියමිත පෝර්මයේ ලියා නැති ටෙන්ඩර් පත්‍ර භාරගනු නොලැබේ.

එක් එක් බන්ධනාගාරය වෙනුවෙන් ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලබන්නේ ඒ ඒ බන්ධනාගාරය වෙනුවෙන් ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනට (9 වැනි ඡෙදය බලන්න) පෙර දින ප.ව. 2.00 දක්වා පමණි.

7. ටෙන්ඩර් භාරගැනීම නැවැත්වූ දින සිට මාස තුනක් යන තුරු ටෙන්ඩර් කරුවන් තම ටෙන්ඩර්පත්‍ර සැලකිල්ලට භාජනය කිරීමට ඉඩ දිය යුතුයි.

8. ටෙන්ඩර්වල සියළුම වෙනස් කිරීම් සහ මැකීම් වලට ටෙන්ඩර්කරු විසින් තමාගේ කෙටි අත්සන යෙදිය යුතුයි.

9. මෙහි පහත සඳහන් පරිදි, ටෙන්ඩර් පත්‍ර සඳහා මුදල් බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ හෝ කච්චේරියක (කොළඹ කච්චේරිය හැර) තැන්පත් කොට එම කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, ටෙන්ඩර් පෝර්ම දෙනු ලැබේ.

යමෙකුට ටෙන්ඩරය පිළිගත් බව ලියමනකින් දන්වනු ලැබීමෙන් දින 10 ක් ඇතුළත කොන්ත්‍රාත්තුවකට හා පොරොන්දුවකට බැඳීමට හෝ අවශ්‍ය ඇප මුදල් ඉදිරිපත් කිරීමට හෝ නුපුළුවන් විනි නම්, තැන්පත් කරන ලද මුදල් රාජසන්තක වෙනවාත් සමගම රජය සම්බන්ධව කවර කොන්ත්‍රාත්තුවකට හෝ බැඳීමට නොහැකි වන සේ ඔහුගේ නම, කොන්ත්‍රාත් කඩකරන්නන්ගේ නාම ලේඛනයට ඇතුළත් කරනවා ඇත.

තවද, කොන්ත්‍රාත්තු කඩකිරීමේ අලාභ වශයෙන් ලංකාවේ මුදලෙන් රු. 2,500 ක් රජය වෙනුවෙන් බන්ධනාගාර කොමසාරිස්වරයාට ගෙවීමට එම ටෙන්ඩර්කරුවාට සිදුවනවා ඇත. මෙම අලාභ මුදල නීති මගින් අයකර ගැනීමේ බලය බන්ධනාගාර කොමසාරිස් වරයා වෙත පැවරී ඇත.

ටෙන්ඩර් භාරගත් බව දැක්වෙන නිවේදනය ටෙන්ඩර්කරු විසින් දෙන ලද ලිපිනයට තැපැලෙන් යවනු ලැබුවහොත්, නැතිනම් එහි ගෙන ගොස් භාර දුන හොත් එම නිවේදනය ලැබුණු ලෙස සලකනු ලැබේ. අන්‍ය සියළු තැන්පත් මුදල් කොන්ත්‍රාත්තුවට අත්සන් තැබීමෙන් පසු ආපසු දෙනු ලැබේ

## බන්ධනාගාර දෙපාර්තමේන්තුව

1973.03.01 සිට 1973.12.31 දක්වා කාලය තුල මහියංගනය සිර කඳවුරට කැළෑ දර සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර බදුල්ල බන්ධනාගාර අධිකාරී විසින් 1973.02.27 දක්වා භාර ගනු ලැබේ.

විස්තර මෙසේය :

සැපයීම පිළිබඳ විස්තර පහත සඳහන් අයුරු :—

විෂ්කම්භය අඟල් 3 කට නොඅඩුවූද, අඟල් 12 ට නොවැඩිවූද, දිග අඟල් 18 කට නොඅඩුවූද, අඟල් 36 කට නොවැඩිවූද, ඉතා හොඳට වියලුනු තද, මේරූ ගැටවලින් තොරවූද, දර කැබලි එවලේම ප්‍රයෝජනයට ගැනීමට තරම් සුදුසු තත්ත්වයකට ඇති ඒවා විය යුතුයි. සපයනු ලබන දර ගොඩපර, දියපර, කටුකැරැල්ල, මී, මිල්ල, හොර, සියඹලා, දවට, පලු, මිහිරිය, දන්, මොර, කුඹුක්, මූනමල්, මාදන්, අලුබෝ ආදී තද ලී වර්ග වලට ඇතුළත් විය යුතුයි. හොණ්ඩරයකට රු. 14 දක්වා වූ ප්‍රමාණයකින් වියලීමට හා පොතු වලට අඩු කරනු ලැබේ.

එමෙන්ම කැන්ද, ඇටඹ, රුක්අත්තන, ගැවලියා, සපු, අඹ, ඇල්බීසියා මාර, කැකුණ, ඊරිය, හික්, මලබොඩ ආදී බුරුල් ලී වර්ග වලට අයත් දර භාරගනු නො ලැබේ.

2. බන්ධනාගාරවල හෝ කිට්ටු කච්චේරියක රු. 10 ක් තැන්පත් කිරීමෙන් ලබාගන්නා ලද කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් අධිකාරී ගෙන්, දර සැපයීම සඳහා ආකෘති පත්‍ර ලබාගත හැක. එම ආකෘති පත් සමග අනුපිටපතක් ද එවිය යුතුයි. පහත සඳහන් ආයතනයන් සඳහා ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමේදී ටෙන්ඩර් තැන්පත් මුදල් ඇවැසි නොවේ :—

(අ) සමුපකාර තොග වෙළඳ ආයතනය ;

(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන ;

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති ;

(ඈ) සමුපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් විසින් ලියා පදිංචි කරන ලද සමුපකාර සමිති.

3. ටෙන්ඩර් පත්‍ර සීල් කරන ලද කවරයක බහා එහි වම් කෙළවරෙහි "දර සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර" යනුවෙන් සඳහන් කොට ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි. එම ටෙන්ඩර් පත්‍ර තැපෑලෙන් එවනු නො ලැබේ නම්, ටෙන්ඩර්කරු විසින් හෝ ඔහුගේ නියෝජිතයා විසින් බන්ධනාගාර ගේට්ටුවේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ ටෙන්ඩර් විවෘත කරන දින නියමිත වේලාවට පෙර බහාලිය යුතුයි.

4. ටෙන්ඩර් පත්‍රයෙහි සඳහන් මිළ ගණන් අකුරෙන් හා ඉලක්කමින් විය යුතුයි. එසේ නොමැති ටෙන්ඩර් ප්‍රතික්ෂේප වීමට ඉඩ ඇත.

5. තෝරාගත් ටෙන්ඩර්කරුට දන්වා යවා දින 10 ක් ඇතුළතදී බන්ධනාගාර අධිකාරී තැන සමග ඒ පිළිබඳ ගිවිසුමකට නොබැඳුනහොත් ඔහු විසින් තැන්පත් කළ ටෙන්ඩර් මුදල රාජසන්තක වීමට ද ඔහුගේ නම රජයේ කොන්ත්‍රාත් කඩකරන්නන්ගේ නම් ලේඛනයට ඇතුළත් වීමට ද ඉඩ ඇත.

6. හැම ටෙන්ඩරයක්ම 1972 පෙබරවාරි මස 27 වෙනි දින පෙරවරු 10.05 ට විවෘත කරනු ලැබේ. එහිදී ටෙන්ඩර්කරුවන්ට පෙනී සිටිය හැක.

7. ටෙන්ඩර් භාරගත් අවසාන දින සිට මාස තුනක් යනතුරු ටෙන්ඩර් කරුවන් විසින් තම ටෙන්ඩර් පත්‍ර සැලකිල්ලට භාජන කිරීමට ඉඩ තැබිය යුතුය.

ඒ. ඒ. ද සිල්වා,
වැ.බ. බන්ධනාගාර කොමසාරිස්.

1973.01.27 වැනි දින,
කොළඹ 9.

මහියංගනය සිර කඳවුරට කැළෑ දර සැපයීම ඇප මුදල රු. 200.

ටෙන්ඩර් පෝර්ම 1973 පෙබරවාරි 27 දින උදේ 10 දක්වා නිකුත් කරනු ලැබේ. ඒවා බදුල්ල බන්ධනාගාර අධිකාරීගෙන් ලබාගත යුතුය.

2–322/3—73.02.09 දින අංක 46 දරණ ගැසට් පත්‍රය

---

## බන්ධනාගාර දෙපාර්තමේන්තුව

1973 මුදල් වර්ෂය තුල, කොළඹ (වැලිකඩ කොළඹ රිමාන්ඩ් සහ මැගසින් බන්ධනාගාර) මහනුවර (බෝගම්බර සහ මහනුවර රිමාන්ඩ් බන්ධනාගාර) මහර, වතුපිටිවල සහ කුණ්ඩසාලේ බන්ධනාගාරවලට වියලි මිරිස් සැපයීම

ඉහත සඳහන් බන්ධනාගාරවලට 1973 මාර්තු 10 දින සිට 1973 දෙසැම්බර් මස 31 වන දින දක්වා කාලය තුල වියළි මිරිස් සැපයීම සඳහා ලාංකිකයන් ගෙන් ටෙන්ඩර් කැඳවනු ලැබේ.

2. ටෙන්ඩර් කරුවන් විසින් හොඳ තත්ත්වයේ, හොඳින් වියලුනු වියළි මිරිස් ඒ ඒ බන්ධනාගාර වලට ගෙනවුත් භාරදිය හැකි මිළ ගණන් තම ටෙන්ඩර් පත්‍රවල සඳහන් කළ යුතුය. මිළ ගණන් ඉදිරිපත් කළ යුත්තේ රාත්තල් ක්‍රමයකටය.

3. ටෙන්ඩර් පෝර්ම කොළඹ, බේස්ලයින් පාරේ පිහිටි බන්ධනාගාර කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් ලබාගත හැකිය. නියමිත පෝර්මයේ ලියා නැති ටෙන්ඩර් පත්‍ර භාරගනු නොලැබේ. එක් එක් බන්ධනාගාර වෙනුවෙන් ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලබන්නේ ඒ ඒ බන්ධනාගාරය වෙනුවෙන් ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනයට පෙර දින ප.ව. 2 දක්වා පමණි.

4. සියලුම ටෙන්ඩර් පත්‍ර අනු පිටපතක් සහිතව, ලියුම් කවරයක බහා සීල් තබා, සභාපති, ටෙන්ඩර් මණ්ඩලය, බන්ධනාගාර දෙපාර්තමේන්තුව කියා එවිය යුතුය. ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. එසේ නොඑවන ටෙන්ඩර් පත්, ටෙන්ඩර්කරුවා විසින් හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් බන්ධනාගාර මූලස්ථානයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුය.

5. ටෙන්ඩර් පත්‍ර බහාලූ කවරයේ වම් කෙළවරේ "......................... ගන්ධනාගාරයට වියලි මිරිස් සැපයීමේ ටෙන්ඩරය" යනුවෙන් ලියා මෙහි උපලේඛනයේ දක්වෙන දිනයන්හි පෙරවරු 10.30 ට පෙර බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති නමට එවිය යුතුය. ටෙන්ඩර්කරුවනට අවශ්‍ය නම් එදින විවෘත කරන වේලාවට එහි පෙනී සිටීමට ඉඩ දෙනු ලැබේ. මෙහි උපලේඛණයේ සඳහන් දින පෙ.ව. 10.35 ට ටෙන්ඩර් පත්‍ර බන්ධනාගාර මූලස්ථානයේදී විවෘත කරනු ලැබේ.

6. ටෙන්ඩර් වල සියලු මැකීම් හා වෙනස් කිරීම් වලට ටෙන්ඩර්කරු තම කෙටි අත්සන තැබිය යුතුය.

7. මෙහි උපලේඛණයේ සඳහන් පරිදි ටෙන්ඩර් පත්‍ර සඳහා මුදල්, බන්ධනාගාර මූලස්ථානයේ ප්‍රධාන කාර්‍යාලයේ හෝ කොළඹ කච්චේරිය හැර අන් ඕනෑම කච්චේරියක හෝ බැඳ එම කුවිතාන්සිය ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

8. යමෙකුට තම ටෙන්ඩරය පිළිගත් බව දන්වා ලිපිය ලැබී දින 10 ක් තුල කොන්ත්‍රාත්තුවට හා ඇප කරයකට බැඳීමට අපොහොසත් වුවහොත් හෝ අවශ්‍ය ඇප මුදල් ඉදිරිපත් කිරීමට නොහැකි තැන්පත් කල මුදල් රාජසන්තක වෙනවාත් හැර රජය සමඟ කවර කොන්ත්‍රාත්තුවකටවත් එලඹිය නොහැකි සේ ඔහුගේ නම කොන්ත්‍රාත් කඩකල අයගේ නාම ලේඛණයට ඇතුලත් කරනවා ඇත. කොන්ත්‍රාත් කඩ කිරීමේ අලාභය වශයෙන් රුපියල් 1.000 ක් අයකර ගැනුමේ බලය ද නීති මගින් බන්ධනාගාර කොමසාරිස් තුමා වෙත පැවරී ඇත.

9. ඕනෑම ටෙන්ඩරයක් ප්‍රත්ක්ෂේප කිරීමේ හෝ ටෙන්ඩර් පත්‍ර සියල්ලම එකවර ප්‍රතික්ෂේප කිරීමේ බලය මුලුමණින් ම ටෙන්ඩර් මණ්ඩලය සතුව තබාගනු ලැබේ.

10. දනට රජයේ කොන්ත්‍රාත්තුවක් භාර ගෙන නොමැති ටෙන්ඩර් කරුවෙක් ටෙන්ඩර් පෝර්ම ඉල්ලා සිටීමේදී තම ඉඩ කඩම් සම්පූර්ණ ලිපිනය හා පදිංචි පලාතද ඇතුළත් විස්තර ලිපියක් එම ඉඩම් ආදිය පිහිටි දිස්ත්‍රික්කයේ ආදායම් පාලක නිළධාරි තැනගේ සහතිකයද සමඟ ඉදිරිපත් කළ යුතුය.

11. මෙ පිළිබඳ වැඩි විස්තර බන්ධනාගාර කොමසාරිස්වරයාගේ කාර්යාලයෙන් ලබාගත හැකිය.

ඒ. ඒ. ද සිල්වා,
වැ.බ. බන්ධනාගාර කොමසාරිස්.

1963.01.27 වැනි දින
කොළඹ බන්ධනාගාර මූලස්ථානය.

### ඉහත සඳහන් උපලේඛනය

| බන්ධනාගාරය | ටෙන්ඩර් තැන්පත් මුදල රු. | ශ. | ඇප තැන්පත් මුදල රු. | ශ. | ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය සහ විවෘත කරන දිනය |
|---|---|---|---|---|---|
| කොළඹ බන්ධනාගාර | ... 50 | 0 | ... 1,000 | 0 | 22.03.73 |
| මහර බන්ධනාගාර | ... 25 | 0 | ... 500 | 0 | |
| මහනුවර බන්ධනාගාර | ... 25 | 0 | ... 500 | 0 | |
| වතුපිටිවල බන්ධනාගාරය | ... 25 | 0 | ... 200 | 0 | |
| කුණ්ඩසාලේ බන්ධනාගාර | ... 25 | 0 | ... 200 | 0 | |

2—322/4—73.02.09 දින අංක 46 දරණ ගැසට් පත්‍රය

# තීරණය කළ ටෙන්ඩර්පත් පිළිබඳ දැන්වීම්

**පුද්ගලයින් ලියා පදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව**

ටෙන්ඩර් ප්‍රතිඵල

| විෂය | අවසන් කළ දිනය | ලැබුන මිළ ගණන් සංඛ්‍යාව | සාර්ථක ටැන්ඩර්කරුගේ නම සහ ලිපිනය | කැබිනට්ටුවක් සඳහා ගාස්තු ප්‍රමාණය |
|---|---|---|---|---|
| මෙරට නිෂ්පාදිත සුවිපත් කැබිනට්ටු 200 සැපයීම ... | 14.11.72 ... | අටයි (8) ... | මිල් ඉක්විප්මන්ට් කොම්පැණි, අම්පිටිය | එක් කැබිනට්ටුවකට රු. 740 බැගින් |

1973.01.25 දින,
සී–45, කැප්පෙටිපොල මාවත,
කොළඹ 5.

කොමසාරිස්.

2–321—73.02.09 දින අංක 46 දරණ ගැසට් පත්‍රය

---

# බඩු බාහිරාදිය විකිණීම

**ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව**

**ප්‍රසිද්ධ වෙන්දේසියයි**

සණ යාර 600 ක පමණ පිටපලු මා විසින් 1973 පෙබරවාරි මස 24 වැනි දින ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් කිලිනොච්චිය ලී මෝලේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. පිටපලු යාර සියයේ ගොඩවල් වශයෙන් වෙන්දේසි කරනු ලැබේ.

ඉහත සඳහන් දේවල් මිලදී ගැනීමට බලාපොරොත්තු වන අයට ඒවා සතියේ දිනවල පෙරවරු 7.45 සිට පස්වරු 4.30 දක්වාද සෙනසුරාද දිනයන්හි පෙරවරු 7.45 සිට පස්වරු 12 දක්වාද කිලිනොච්චිය ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තු ලී මෝලේ දී පරීක්ෂා කර බැලිය හැක.

ගැනීමට බලාපොරොත්තු වන අයට එක් තොගයක් හෝ ඊට වැඩි ගණනක් නැතහොත් මුළු තොගයම හෝ මිලදී ගත හැකිය. වෙන්දේසියෙන් මෙම පිටපලු ලබාගන්නා අයට ඒවා තෝරීමට හෝ නුසුදුසු යැයි ඉවත් කිරීමට අවසර නැත.

වෙන්දේසියේදී නියමවූ මුදලින් සියයට දහයක් (10%) එම ස්ථානයේදීම ගෙවිය යුතු අතර ඉතිරි මුදල දින තුනක් ඇතුළත මගේ කාර්යාලයේ තැන්පත් කළ යුතුය. දින තුනකින් ඉතිරි මුදල ගෙවීමට නොහැකි වන අයගේ සියයට දහයේ (10%) මුදල අවලංගු වේ.

තමන් මිලට ගන්නා පිටපලු සති දෙකක් ඇතුළත (වෙන්දේසි කළ දින සිට) ඉවත් කර ගත යුතුය.

වෙන්දේසියෙන් මෙම පිටපලු ලබා ගන්නා අය ඉහත සඳහන් කොන්දේසි වලට අනුව ක්‍රියා කළ යුතු අතර වැඩිමනත් තොරතුරු අවශ්‍ය නම් පහත සඳහන් මගෙන් හෝ කිලිනොච්චිය ලී මෝලෙන් ලබා ගත හැකිය. තවද ගැනීමට බලාපොරොත්තු වන අය වෙන්දේසියේ විකිණීමට පෙර මවිසින් ප්‍රකාශ කෙරෙන කොන්දේසි වලට ද එකඟ විය යුතුය.

එස්. කුමාරසාමි,
ඉඩම් සංවර්ධන නිලධාරි, මාන්කුලම.

1973 ජනවාරි මස 22 වැනි දින,
මාන්කුලම ඉඩම් සංවර්ධන කාර්යාලයේදී ය.

2–230—73.02.09 දින අංක 46 දරණ ගැසට් පත්‍රය

---

**යුද හමුදා මූලස්ථානය**

**පරිහරණයට නුසුදුසු භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

පහත දැක්වෙන පරිහරණයට නුසුදුසු භාණ්ඩ 1973 පෙබරවාරි මස 28 වෙනි බදාදා පෙරවරු 10 ට හෝමාගම, පනාගොඩ පිහිටි යුද හමුදා යුද්ධෝපකරණ ගබඩාවේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ :—

(අ) යාන්ත්‍රික ප්‍රවාහන කොටස්.
(ආ) විද්‍යුත් උපකරණ.
(ඇ) ටයර් සහ ටියුබ්.
(ඈ) ක්‍රීඩා භාණ්ඩ.
(ඉ) ඉංජිනේරු උපකරණ.
(ඊ) ඉනැමල් භාණ්ඩ.
(උ) වෙනත් මිශ්‍ර භාණ්ඩ.
(ඌ) ඩුප්ලිකේටිං මෙෂින්.
(එ) යතුරු ලියන.
(ඒ) බයිසිකල්.

2. මිලදී ගන්නාලද සියළුම භාණ්ඩ සඳහා සම්පූර්ණයෙන් මුදල් ගෙවිය යුතු අතර, එදිනම පස්වරු 3.30 ට පෙර යුද්ධෝපකරණ ගබඩා පෙදෙසින් සියළුම භාණ්ඩ ඉවත්කර ගතයුතු වේ. චෙක්පත් භාර ගනු නොලැබේ.

3. මෙම භාණ්ඩ 1973 පෙබරවාරි මස 27 වෙනි දින පෙරවරු 9 30 සිට පස්වරු 3.30 දක්වා කාලය තුළ පහත සඳහන් ස්ථානයේදී පරීක්ෂා කළ හැක.

යුද්ධෝපකරණ ගබඩාව,
යුද හමුදා ජනපදය,
පනාගොඩ, හෝමාගම.

ආර්. ඒ. ජයවීර,
බ්‍රිගේඩියර්,
යුද හමුදා ආඥපති වෙනුවට.

යුද හමුදා මූලස්ථානය,
තැ. පෙ. 553, කොළඹ.
1973 ජනවාරි මස 29 දින දී.

2–288—73.02.09 දින අංක 46 දරණ ගැසට් පත්‍රය

---

**සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුව**

**සේවයට අයෝග්‍ය බඩුබාහිරාදිය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

සේවයට අයෝග්‍ය බඩු බාහිරාදිය තොගයක් 1973 පෙබරවාරි 27 වැනි දින පෙ. ව. 10ට රත්මලානේ කොළඹ ගුවන් තොටුපලේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

2. විකුණනු ලබන දින පෙ. ව. 8 සිට මෙම බඩු බාහිරාදිය පරීක්ෂා කර බැලීම පිණිස තබනු ලබනවා ඇත. සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ, තැ. පෙ. 535, කොළඹ 1 යන ලිපිනයට ඉල්ලුම් පතක් එවීමෙන් හෝ රත්මලානේ ගුවන් තොටුපල කොමඩාන්ට් වෙතින් හෝ මෙම බඩු බාහිරාදියේ ලැයිස්තුවක් ලබා ගත හැකිය.

3. මිලදී ගනු ලබන බඩු බාහිරාදිය සඳහා එම ස්ථානයේ දීම මුදල් ගෙවිය යුතු වන අතර බඩු බාහිරාදිය එදින පස්වරු 3.30 ට පෙර ඉවත් කරගත යුතුය.

සී. ඩබ්ලිව්. ආර්. අපොන්සො,
සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ.

1973. 01. 26 දා,
කොළඹ 1,
සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුවේ දී ය.

2–235—73.02.09 දින අංක 46 දරණ ගැසට් පත්‍රය

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

හොරණ රජයේ ගොවිපලේ ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

1973 ජනවාරි මස 26 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පලකර තිබුණ ඉහත සඳහන් වෙන්දේසිය 1973 පෙබරවාරි මස 26 දින දක්වා දීර්ඝ කර ඇති බව මෙයින් දන්වා සිටිමි.

1973.1.26 දින,
ගොවිපල් පාලන හා නිෂ්පාදන කාර්යාලය,
තැ. පෙ. 622, පලතුරු කම්හල පාර,
කොළඹ 5.

ඒ. පී. ජී. අබේසූරිය,
පරිපාලන නිලධාරී (ගො. පා. හා නි).

2–284—73.02.09 දින අංක 46 දරණ ගැසට් පත්‍රය

---

දැන්වීමයි

පල්ලේකැලේ කුණ්ඩසාලේ එළිමහන් සිර කඳවුරු ගොවිපලේ ලාජ් වයිට් වර්ගයේ ලොකු ඌරෙක් සහ ඊරියන් දෙදෙනෙක් 1973 පෙබරවාරි මස 28 වෙනි දින පෙ. ව. 10.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. වෙන්දේසියෙන් සතුන් මිලදී ගත් විගසම සතුන් රැගෙන යාමට කටයුතු යොදා ගත යුතුයි. මෙම සතුන් සතියේ දින වල උදේ 8.00 සිට සවස 2.00 දක්වාත් සෙනසුරාදා දිනවල උදේ 8.00 සිට දවල් 12.00 දක්වාත් ගොවිපොලේදී බැලීමට පුළුවන.

පී. ඩබ්ලිව්. පෙරේරා,
බන්ධනාගාර අධිකාරී.

එළිමහන් සිර කඳවුර,
පල්ලෙකැලේ-කුණ්ඩසාලේ,
1973. 01. 20.

2–350—73.02.09 දින අංක 46 දරණ ගැසට් පත්‍රය

---

# ආණ්ඩුවේ නොවන දැන්වීම්

නොතාරිස් අවසාන පරීක්ෂණයට ඉල්ලීමට පළමුව කරණ දැන්වීමයි

කළුතර දිස්ත්‍රික්කයේ විදාගම බණ්ඩාරගම පදිංචි මුදලිගේ දෝන පියසිලි වන මම මෙදින සිට පූර්ණ මාසයක් ගත වූ පසු කළුතර දිස්ත්‍රික්කයේ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු වශයෙන් ඇතුලත් වීම පිණිස නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම සඳහා අවසර දෙන ලෙස රෙජිස්ට්‍රාර් ජනරාල් තුමාගෙන් ඉල්ලා සිටින බව නොතාරිස් ආඥපණතේ 107 අධිකාරය 7 වෙනි වගන්තියේ ප්‍රකාර මෙයින් දන්වා සිටිමි.

මෙයට,
ඇම්. ඩී. පියසිලි.

ඇම්. ඩී. පියසිලි,
ගොඩපරගහ වත්ත,
විදාගම-බණ්ඩාරගම,
1972 මැයි මස 4 වැනි දින දිය.

2–339—73.02.09 දින අංක 46 දරණ ගැසට් පත්‍රය

---

නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙරතුව කරන දැන්වීමයි

කුරුණෑගල දිස්ත්‍රික්කයේ අලව්වේ පදිංචි පුංචිමුදියන්සේලාගේ පොඩිරාලහාමි ජයතිලක වන මම අද සිට පූර්ණ මාසයක් ඇතුලත කුරුණෑගල දිස්ත්‍රික්කයේ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු වශයෙන් ඇතුලත් වීම සඳහා නොතාරිස් අවසාන විභාගයට පෙනී සිටීමට අවසර දෙන ලෙස රෙජිස්ට්‍රාර් ජනරාල් තුමාගෙන් ඉල්ලා සිටින බව 1907 නොතාරිස් ආඥපනතේ 7 වෙනි වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙමි.

පී. ඇම්. පී. ජයතිලක.

1973 ජනවාරි 28.

2–341—73.02.09 දින අංක 46 දරණ ගැසට් පත්‍රය

---

නොතාරිස් අවසාන පරීක්ෂණයට ඉල්ලීමට පෙර කරන නීත්‍යානුකූල දැන්වීමයි

මහනුවර දිස්ත්‍රික්කයේ මහනුවර පේරාදෙණිය පාරේ අංක 511 දරණ නිවසෙහි පදිංචි වගසෙනෙවිරත්ගේ ලයනල් බර්නාඩ් සෙනෙවිරත්න වන මම මහනුවර දිස්ත්‍රික්කයේ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු වශයෙන් ඇතුලත් වීම සඳහා නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට අවසර දෙන ලෙස රෙජිස්ට්‍රාර් ජනරාල් තුමාගෙන් ඉල්ලා සිටින බව නොතාරිස් ආඥපණතේ 107 වන පරිච්ඡේදයේ 7 වන වගන්තියේ පළමුවෙන උප ලේඛණයේ "ආ" කොටසේ දෙවන නියෝගය ප්‍රකාර මෙයින් දන්වා සිටිමි.

මෙයට,
ඩබ්ලිව්. ඇල්. බී. සෙනෙවිරත්න.

1973 ජනවාරි 30 වෙනිදා.

2–340—73.02.09 දින අංක 46 දරණ ගැසට් පත්‍රය

---

දැන්වීමයි

කෑගල්ල දිස්ත්‍රික්කයේ රඹුක්කන නවගමුවේ පදිංචි බමුණු ආරච්චිගේ සර්නේලිස් පෙරේරා වන මම සිංහල නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල් තුමා වෙත අයදුම් පතක් ඉදිරිපත් කරන බව මෙයින් දැනුම් දෙමි.

බී. එස්. පෙරේරා.

2–335—73.02.09 දින අංක 46 දරණ ගැසට් පත්‍රය

---

දැන්වීමයි

ගම්පහ අධිකරණ දිස්ත්‍රික්කයේ මණ්ඩාවල පදිංචි රාජකරුණා මොහොට්ටි අප්පුහාමිලාගේ සිරිසේන රාජකරුණා වන මම, අද දින සිට මාසයක් ගතවූ පසු කොළඹ දිස්ත්‍රික්කය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු වශයෙන් පත්කරනු ලැබීමට රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් ඉල්ලා සිටින බව, නොතාරිස්වරුන් පිළිබඳ වූ 107 වැනි අධිකාරයේ 7 වැනි වගන්තියේ පළමුවැනි උපලේඛනයේ "ආ" කොට්ඨාශයේ 2 වැනි ව්‍යවස්ථාවේ ප්‍රකාර මෙයින් දැනුම් දෙමි.

ආර්. එම්. ඒ. එස්. රාජකරුණා.

2–344—73.02.09 දින අංක 46 දරණ ගැසට් පත්‍රය

---

දැන්වීමයි

කිනිගොඩ කෝරලේ වල්ගම පත්තුවේ හේවාදිවෙල "ශාන්ති" යෙහි පදිංචි පෙඩ්රික් ජෝර්ජ් විජේසිරි ගොඩකුඹුර වන මම වර්ෂ 1907 අංක 1 දරණ නොතාරිස් ආඥපණතේ 7 වන වගන්තියේ ප්‍රකාර මෙදින සිට පූර්ණ මාසයක් ඉකුත්වූ පසු කෑගල්ල දිස්ත්‍රික්කයේ සිංහල භාෂාවෙන් ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු වශයෙන් කටයුතු කිරීම සඳහා නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටින බව රෙජිස්ට්‍රාර් ජනරාල් තුමා වෙත මෙයින් දන්වා සිටිමි.

මෙයට,
ඇෆ්. ජී. ඩබ්ලිව්. ගොඩකුඹුර.

1973. 1. 30.

2–336—73.02.09 දින අංක 46 දරණ ගැසට් පත්‍රය

### නොතාරිස් ආඥපණතේ ප්‍රකාර දැන්වීමයි

කුරුණෑගල දිස්ත්‍රික්කුවේ නාරම්මල මීගමුව පාරේ "ඩයස් පියස" හි පදිංචි වෛද්‍යකාර කංකානම්ගේ පෝල් එඩ්වින් ඩයස් වන මම නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම සඳහා සහ එම කුරුණෑගල දිස්ත්‍රික්කය තුල සිංහල භාෂාවෙන් වැඩකරණ නොතාරිස්වරයෙකු වශයෙන් ඇතුලත් කරගනු ලැබීම සඳහාත් රෙජිස්ට්‍රාර් ජනරාල් තුමාගෙන් ඉල්ලා සිටින බව නොතාරිස් ආඥපණතේ පළමු වන උපලේඛණයේ "ආ" කොටසේ 7 වන වගන්තියේ 2 වන නියෝගයේ සඳහන් ප්‍රකාර ශ්‍රී ලංකා ජන රජයට සහ මහජනයාටත් මෙයින් දන්වා සිටිමි.

1973 ජනවාරි 26,

පෝල් එඩ්වින් ඩයස්.

"ඩයස් පියස",
මීගමුපාර,
නාරම්මල.

2-337—73.002.09 දින අංක 46 දරණ ගැසට් පත්‍රය

---

### නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම සඳහා කරන නීත්‍යානුකූල දැන්වීමයි

කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැඋඩ විල්ලි හත්පත්තුවේ තිරගන් දහය කෝරලේ මල්කඩුවාවේ අංක 96 සා. ඇන්තනි වත්තේ පදිංචි වර්ණකුලසූරිය ඇල්ප්‍රඩ් ප්‍රනාන්දු වන මම කුරුණෑගල අධිකරණ කොට්ඨාසය තුල සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු ලෙස ඇතුළුවීම සඳහා නොතාරිස් වෘත්ත් පිළිබඳ අවසාන පරීක්ෂණයට පෙනීසිටීමට අවසර දෙන ලෙස රෙජිස්ට්‍රාර් ජනරාල් තුමාගෙන් ඉල්ලා සිටින බව නොතාරිස් ආඥපණතේ 7 වැනි වගන්තියේ ප්‍රකාර මෙයින් දන්වා සිටිමි.

1973. 1. 30,

මෙයට,
ඩබ්ලිව්. ඒ. ප්‍රනාන්දු.

අංක 96, සා. ඇන්තනි වත්ත,
මල්කඩුවාව,
කුරුණෑගල.

2-338—73.02.09 දින අංක 46 දරණ ගැසට් පත්‍රය

---

### දන්වීමයි

කොළඹ දිස්ත්‍රික්කයේ වත්තල දූනට පදිංචි ප්‍රතිඥත ලිපිකරු පරණ හේවාගේ ජිනදාස වන මම සිංහල නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම සඳහා අයදුම්පතක් රෙජිස්ට්‍රාර් ජනරාල්තුමා වෙත ඉදිරිපත් කරන බව මෙයින් දනුම් දෙමි.

පී. එච්. ජිනදාස,
ප්‍රතිඥත ලිපිකරු.

1973 ජනවාරි 29 වැනි දින.

2-334—73.02.09 දින අංක 46 දරණ ගැසට් පත්‍රය

---

### නොතාරිස් අවසාන විභාගයට ඉල්ලීමට පෙර කරන නීත්‍යානුකූල දැන්වීමයි

මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර ගඟපලාත දෙහිපාගොඩ ගෙලිඔය ගමේ "තිලක නිවසේ" පදිංචි කරුණාතිලක රාජපක්ෂ වාසල මුදියන්සෙලාගේ කළුබණ්ඩා කරුණාතිලක වන මම අදින් පුරා මසක් ගතවූ පසු මහනුවර දිස්ත්‍රික්කයේ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් වරයකු ලෙස ඇතුලත් වීම සඳහා නොතාරිස් අවසාන විභාගයට පෙනී සිටීමට රෙජිස්ට්‍රාර් ජනරාල් තුමාගෙන් අවසර ඉල්ලා සිටින බව මෙයින් දැනුම් දෙමි.

මීට,
කේ. බී. කරුණාතිලක.

තිලක නිවස,
ගෙලිඔය, 1973. 1. 19 වන දින.

2-295—73.02.09 දින අංක 46 දරණ ගැසට් පත්‍රය

---

### නොතාරිස් අවසාන පරීක්ෂණය සඳහා ඉල්ලීමට පෙර කෙරෙන නීත්‍යානුගත දන්වීමයි

හම්බන්තොට දිස්ත්‍රික්කයේ නැගෙනගිර ගිරුවා පත්තුවේ හාතාගල "චන්දන" නිවසේ පදිංචි "පියෝරිස් එදිරිසූරිය" වන මම අද සිට පුරා මසක් ගතවූ පසු හම්බන්තොට දිස්ත්‍රික්කයේ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු වශයෙන් ඇතුලත් වීම සඳහා නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට අවසර දෙන ලෙස රිජිස්ට්‍රාර් ජනරාල් තුමාගෙන් ඉල්ලා සිටින බව 1907 නොතාරිස් ආඥපණතේ 7 වෙනි වගන්තියේ ප්‍රකාර මෙයින් දන්වා සිටිමි.

මෙයට,
පී. එදිරිසූරිය.

1973. 1. 25 වන දින.

2-296—73.02.09 දින අංක 46 දරණ ගැසට් පත්‍රය

---

### දන්වීමයි

කෑගලු දිස්ත්‍රික්කයේ බෙලිගල් කෝරලේ කඳුපිට පත්තුවේ බල්ලාපාන පදිංචි හොරතල් කුමාර බණ්ඩාරගේ සිමියොන් කරුණාරත්න වන මම මෙදින සිට මාසයක් ගතවූ පසු කෑගලු අධිකරණ කොට්ඨාශයෙහි සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු ලෙස ඇතුලත්වීම සඳහා නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට අවසර දෙන ලෙස රෙජිස්ට්‍රාර් ජනරාල් තුමා ගෙන් ඉල්ලා සිටින බව නොතාරිස් ආඥ පණතේ 7 වන වගන්තියේ ප්‍රකාර මෙයින් දන්වා සිටිමි.

එච්. ඇස්. කරුණාරත්න.

1973. 1. 29

2-345—73.02.09 දින අංක 46 දරණ ගැසට් පත්‍රය

---

### දන්වීමයි

කුරුණෑගල දිසාවේ වැල්ලව මැද්දේගම පදිංචි ජෝර්ජ් ස්ටීවන් ධර්මතිලක වන මම, නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම සඳහා සහ කුරුණෑගල දිසාව තුළ සිංහල භාෂාවෙන් වැඩ කරන නොතාරිස් වරයෙකු වශයෙන් ඇතුළත් කර ගන්නා ලෙසත් රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් ඉල්ලා සිටින බව නොතාරිස් ආඥාපනතේ 7 වන වගන්තියේ ප්‍රකාර ආණ්ඩුවට සහ මහජනයාට මෙයින් දන්වමි.

ජෝර්ජ් ස්ටීවන් ධර්මතිලක.

මැද්දේගම,
වැල්ලව, 29.01.73.

2-298—73.02.09 දින අංක 46 දරණ ගැසට් පත්‍රය

---

### නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම සඳහා ඉල්ලීමට පෙර කෙරෙන නීත්‍යානුකූල දැන්වීමයි

කළුතර දිස්ත්‍රික්කයේ රයිගම් කෝරළයේ කුඹුකේ පත්තුවේ කුඹුකේ "දැරණියගල වලව්වේ" පදිංචි සමරසුන්දර ආරච්චිගේ පීටර් සමරසුන්දර වන මා මෙවක් පටන් පුරා මාසයක් ගත වූවාට පසු පානදුර උසාවි බලමණ්ඩලය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු වශයෙන් ඇතුළත් වීම සඳහා අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට අවසර දෙන ලෙස රෙජිස්ට්‍රාර් ජනරාල් තුමාගෙන් ඉල්ලා සිටින බව නොතාරිස් ආඥපනතේ (1) වැනි උපලේඛනයේ (ආ) ආකෘති පත්‍රයේ 2 වැනි වගන්තියේ ප්‍රකාර මෙයින් දනුම් දෙමි.

එස්. ඒ. පී. සමරසුන්දර.

"දැරණියගල වලව්ව"
කුඹුක, ගෝනපොලහන් දිය.
1973 ජනවාරි 27.

2-299—73.02.09 දින අංක 46 දරණ ගැසට් පත්‍රය

---

### දන්වීමයි

වතුගෙදර පරගහතොට පදිංචි කලුතන්තිරි පටබැඳි විජිත් ද සිල්වා වන මම මෙවක් සිට පුරා මාසයක් ගතවූ පසු බලපිටියේ අධිකරණ කොටසෙහි ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු ලෙස ඇතුළත් කරගන්නා මෙන් රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් ඉල්ලා සිටින බව නොතාරිස් ආඥපනතේ 7 වන වගන්තියේ "ආ" උපලේඛනයෙයි 2 වන වගන්තියේ පරිදි රජයට සහ මහජනයාටත් මෙයින් දනුම් දෙමි.

කේ. පී. විජිත් ද සිල්වා.

2-301—73.02.09 දින අංක 46 දරණ ගැසට් පත්‍රය

### දැන්වීමයි

කොළඹ දිස්ත්‍රික්කයේ දෙපානම පදිංචි ප්‍රතිඥත ලිපිකරු, කිරිවල ගමගේ මාටින් වන මම, සිංහල නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම සඳහා අයදුම් පතක් රෙජිස්ට්‍රාර් ජනරාල් තුමා වෙත ඉදිරිපත් කරන බව මෙයින් දැනුම් දෙමි.

කේ. ජී. මාටින්,
ප්‍රතිඥත ලිපිකරු.

1973 ජනවාරි මස 27 වැනි දින,

2–330—73.02.09 දින අංක 46 දරණ ගැසට් පත්‍රය

---

### නොතාරිස් අවසාන පරීක්ෂණයට ඉල්ලීමට පෙරාතුව කෙරෙන නීත්‍යානුගත දැන්වීමයි

මහනුවර දිසාවේ පාතහේවාහැටේ ගන්දහයේ කෝරළේ තැන්නේකුඹුරේ අංක 167 හි පදිංචි කුරුල්ලන්මඩුවේ ගෙදර සිරිසේන වන මම, මහනුවර දිස්ත්‍රික්කයේ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු වශයෙන් ඇතුළත් වීම සඳහා නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට අවසර දෙන ලෙස රෙජිස්ට්‍රාර් ජනරාල් තුමාගෙන් ඉල්ලා සිටින බව නොතාරිස් ආඥ පනතේ 107 වන පරිච්ඡේදයේ 7 වන වගන්තියේ පළමුවන උප ලේඛණයේ "ආ" කොටසේ 2 වන නියෝගය ප්‍රකාර මෙයින් දන්වා සිටිමි.

මෙයට,

1973 ජනවාරි මස 29 වැනි දින, කේ. ඇම්. සිරිසේන.
167, තැන්නේකුඹුර,
මහනුවර.

2–325—73.02.09 දින අංක 46 දරණ ගැසට් පත්‍රය

---

### දැන්වීමයි

කුරුණෑගල දිස්ත්‍රික්කයේ කටුගම්පළ හත්පත්තුවේ මැදපත්තු බස්නාහිර කෝරළේ යක්විල තැපැල්වූ ඊරියගොල්ලේ "හේරත් පහයේ" පදිංචි හේරත් මුදියන්සේලාගේ විමලසේන හේරත් වන මම නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම සඳහා සහ නොතාරිස් කෙනෙකු වශයෙන් ඇතුළත් කරගන්නා ලෙසත් රෙජිස්ට්‍රාර් ජෙනරාල් තුමාගෙන් ඉල්ලා සිටින බව නොතාරිස් ආඥපණතේ 7 වෙනි වගන්තියේ ප්‍රකාර මෙයින් එළිදරව් කරමි.

එච්. ඇම්. ඩබ්ලිවු. හේරත්.

30. 1. 1973.

2–297—73.02.09 දින අංක 46 දරණ ගැසට් පත්‍රය

---

### නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම සඳහා ඉල්ලීමට පෙර කරනු ලබන නීත්‍යානුකූල දැන්වීමයි

කුරුණෑගල දිස්ත්‍රික්කයේ අලව්වේ පදිංචි හේරත් මුදියන්සේලාගේ විජේකෝන් බණ්ඩාර වන මම මෙදින සිට පුරා මසක් ගතවූ පසු කුරුණෑගල දිස්ත්‍රික්කයේ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිඛ නොතාරිස් කෙනෙකු වශයෙන් ඇතුළත් වීම පිණිස නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට අවසර දෙන ලෙස රෙජිස්ට්‍රාර් ජනරාල් තුමාගෙන් ඉල්ලා සිටින බව 1907 නොතාරිස් ආඥපනතේ 7 වෙනි වගන්තියේ පළමුවන උපලේඛනයේ "ආ" කොටසේ දෙවෙනි ව්‍යවස්ථාව අනුව මෙයින් දැනුම් දෙමි.

හේ. මු. වි. බණ්ඩාර.

1973 ජනවාරි මස 25 දින.

2–300—73.02.09 දින අංක 46 දරණ ගැසට් පත්‍රය

---

### දැන්වීමයි

කුරුණෑගල දිසාවේ මාවතගම උඩදෙනියේ පදිංචි පීටර් වික්‍රමගේ වන මම, කුරුණෑගල දිසාවේ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු වශයෙන් ඇතුළත් වීම සඳහා, නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට අවසර දෙන ලෙස රෙජිස්ට්‍රාර් ජනරාල් තුමාගෙන් ඉල්ලා සිටින බව නොතාරිස් ආඥ පනතේ 7 වැනි වගන්තියේ ප්‍රකාර මෙයින් දන්වා සිටිමි.

පී. වික්‍රමගේ.

1973. 1. 29 වන දින.

2–309—73.02 .09 දින අංක 46 දරණ ගැසට් පත්‍රය

---

### නොතාරිස් ආඥපනත යටතේ දැන්වීමයි

මහනුවර දිස්ත්‍රික්කයේ මීගහහේන පදිංචි උඩගෙදර රතනවතී වන මම කුරුණෑගල සිංහල නොතාරිස් වරියක වීමට 1973 අප්‍රියෙල් නොතාරිස් අවසාන විභාගය ඉල්ලන බව මෙයින් දන්වමි.

යු. රතනවතී.

2–308—73.02.09 දින අංක 46 දරණ ගැසට් පත්‍රය

---

### දැන්වීමයි

ගාලු දිසායෙහි ගාලු කඩවත් සතර තුල පෝද්දලට අයත් තරාවල 'නන්දන' හි පදිංචි තරාවල බොකරගොඩගේ කමලා චන්ද්‍රසිලි වන මම නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම සඳහාත් ගාලු දිසායෙහි සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු වශයෙන් ඇතුලත් කරගනු ලැබීම සඳහාත් රිජිස්ට්‍රාර් ජනරාල් තුමාගෙන් ඉල්ලා සිටීමට අදහස් කර ඇති බව නොතාරිස් ආඥපණතේ 7 වැනි වගන්තියේ ප්‍රකාර මෙයින් දන්වමි.

මෙයට,
එන්. බී. කේ. චන්ද්‍රසිලි

2–306—73.02.09 දින අංක 46 දරණ ගැසට් පත්‍රය

---

### ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු වශයෙන් ඇතුලත් කර ගන්නා ලෙස කරන ඉල්ලීමයි

කළුතර දිස්ත්‍රික්කයේ රයිගම් කෝරළේ හඳපාන්ගොඩ "නිසසල" නිවසේ පදිංචි ධර්මදාස ජයසිංහ වන මම අද දින සිට පුරා මාසයක් ගතවූ පසු කළුතර දිස්ත්‍රික්කයේ සිංහළ භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන් ඇතුළත් වීම පිණිස නොතාරිස් අවශාන පරීක්ෂණයට පෙනී සිටීමට වෂී 1907 අංක 1 දරන නොතාරිස් ආඥපනතේ 7 වැනි වගන්තියේ පළමුවැනි උප වගන්තියේ "ආ" කොටසේ 2 වැනි ව්‍යවස්ථාවේ ප්‍රකාර රෙජිස්ට්‍රාර් ජනරාල් තුමාගෙන් ඉල්ලා සිටින බව මෙයින් දැනුම් දෙමි.

ඩී. ජයසිංහ.

2–304—73.02.09 දින අංක 46 දරණ ගැසට් පත්‍රය

---

### නොතාරිස්වරුන් පිළිබඳ අවසාන පරීක්ෂණයට ඉල්ලීමට පෙරාතුව කෙරෙන නීත්‍යානුගත දැන්වීම

කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරළයේ උඩුගහපත්තුවේ කළුඅග්ගල-හන්වැල්ල පදිංචි ජාලිස් ගතෝ ආරච්චි පතිරණ වන මම මෙදින සිට පුරා මසක් ගතවූ පසු කොළඹ දිස්ත්‍රික්කයේ අවිස්සාවේල්ල අධිකරණ කොට්ඨාශය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනෝකු වශයෙන් ඇතුළත් වීම පිණිස නොතාරිස් වරුන් පිළිබඳ අවසාන පරීක්ෂණයට පෙනී සිටීම සඳහා අවසර ලැබෙන ලෙස රෙජිස්ට්‍රාර් ජනරාල් තුමාගෙන් ඉල්ලා සිටින බව 1954, නොතාරිස් ආඥපනතේ (සිංහල මුද්‍රණය) 7 වැනි වගන්තිය යටතේ එම පනතේ පළමුවැනි උප ලේඛනය "ආ" කොටසේ 2 වැනි ව්‍යවස්ථාවේ ප්‍රකාර මෙයින් එළිදරව් කරමි.

ජා. ග. පතිරණ,

1973 ජනවාරි මස 27 දින.

2–307—73.02.09 දින අංක 46 දරණ ගැසට් පත්‍රය

### දැන්වීමයි

කළුතර දිස්ත්‍රික්කයේ බැල්ලපිටියේ දැනට පදිංචි, හෙට්ටි ආරච්චිගේ දොන් ඊඩින් ගුණසිරි වන මම, කළුතර දිස්ත්‍රික්කයේ සිංහල භාෂාවෙන් වැඩ කරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු මෙන් ඇතුලත් වීම පිණිස නොතාරිස්වරුන්ගේ අවසාන පරීක්ෂණයට පෙනී සිටීම සඳහා මෙවක් පටන් මාසයක් ගතවූ තැනදී රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් ඉල්ලුම්කර සිටින බව වර්ෂ 1907 අංක 1 දරණ නොතාරිස් ආඥාපනතේ 1 වෙනි උපලේඛනයේ "ආ" කොටසේ 2 වෙනි නියෝගයේ ප්‍රකාර මෙයින් දැනුම් දෙමි.

එච්. ඩී. ඊ. ගුණසිරි.

1973 ජනවාරි මස 31 වෙනි දින,
හොරණ බැල්ලපිටියේ දී ය.

2-323—73.02.09 දින අංක 46 දරණ ගැසට් පත්‍රය

---

### දැන්වීමයි

ජා-ඇල නිවන්දම පදිංචි දොන් එඩ්වින් නාලවත්ත අභයසිංහ වන මම අද සිට පුරා මසක් ගතවූ පසු කොළඹ දිස්ත්‍රික්කය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන් ඇතුලත් වීම පිණිස නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම සඳහා අවසර දෙන ලෙස රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් ඉල්ලා සිටින බව නොතාරිස් ආඥාපනතේ 7 වෙනි වගන්තියේ ප්‍රකාර මෙයින් දැනුම් දෙමි.

ඩී. ඊ. එන්. අභයසිංහ.

1972 ජනවාරි මස 26 දින.

2-302—73.02.09 දින අංක 46 දරණ ගැසට් පත්‍රය

---

### දැන්වීමයි

ගාලු දිසාවේ ගඟබඩ පත්තුව බද්දේගම අගලිය "ගඟබඩ" හි පදිංචි රොබර්ට් සූරිආරච්චි වන මම, සිංහල නොතාරිස් අවසාන පරීක්ෂණයට ඉදිරිපත් වීම සඳහා අයදුම්පතක් රෙජිස්ට්‍රාර් ජනරාල් තුමා වෙත ඉදිරිපත් කරන බව මෙයින් දැනුම් දෙමි.

ආර්. සූරිආරච්චි,
ප්‍රතිශ්‍රුත ලිපිකරු.

25. 1. 1973,
අගලිය-බද්දේගම.

2-303—73.02.09 දින අංක 46 දරණ ගැසට් පත්‍රය

---

### නොතාරිස් අවසාන පරීක්ෂණයට ඉල්ලීමට පළමුව කරන දැන්වීමයි

කොළඹ දිස්ත්‍රික්කයේ මීගමුවේ පදිංචි ඩබ්ලිව්. සිමියොන් අප්පුහාමි යන මම මෙදින සිට පුරා මාසයක් ගත වූ පසු කොළඹ දිස්ත්‍රික්කයේ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු වශයෙන් ඇතුළත් වීම පිණිස නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම සඳහා අවසර දෙන ලෙස රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් ඉල්ලා සිටින බව නොතාරිස් ආඥාපනතේ (107 අධිකාරය) 7 වැනි වගන්තියේ ප්‍රකාර මෙයින් දන්වා සිටිමි.

ඩබ්ලිව්. සිමියොන් අප්පුහාමි.

73.2.9.

2-333—73.02.09 දින අංක 46 දරණ ගැසට් පත්‍රය

---

## වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම්

### ප්‍රසිද්ධ වෙන්දේසියක්

ගාල්ලේ දිස්ත්‍රික් උසාවියේ අංක එම්. බී/1399 දරණ නඩුවෙන් මට ලැබී තිබෙන බලය ප්‍රකාර එම නඩුවේ පත් කරන ලද පැමිණිලිකරු වන අහංගම ගොසියපාමෙන් පදිංචි ගාල්ලෙගේ දිමිදුපාල ද සිල්වාට එම නඩුවේ විත්තිකරු වන තවලම් ගමගේ ගජබද්දර අමරසිංහ ගෙන් අයවිය යුතු මුදල වන රු. 2,597 සහ ඊට 10.8.6 සිට නීති පොලියද, නඩු ගාස්තුව රු. 371.42 ද අයකර ගැනීමට මෙහි



පහත සඳහන් ඉඩම් 1973 පෙබරවාරි මස 24 වෙනි දින උදය 10 ට පටන් ගෙන එම ඉඩම්වලදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. විකිණීමට 2 වෙනි සඳහන් ඉඩම පළමුවෙන් පටන් ගනු ලැබේ. එයට ඉල්ලුම්කරුවන් නැත්නම් 1 වෙනි සහ 3 වෙනි ඉඩම් ඊට පසු විකුණනු ලැබේ. එනම් :—

1. දකුණු පළාතේ ගාලු දිස්ත්‍රික්කයේ හිනිදුම් පත්තුවේ හබරකඩ තවලම පිහිටා තිබෙන බී. එස්. පී. පී. 483 හි අංක 149 දරණ කැබැල්ල වූ අක්කර 5 යි, රූඩ් 2 යි, පර්චස් 30 ක් බිම් ප්‍රමාණ ඇති තිරුවාණකැටිය ඉහළ කැබැල්ල සහ මැද ඔවිට යන ඉඩමේ සියලු ගහ කොළ සහ පළතුරු සහ බිමද වර්ෂ 1940 මාර්තු මස 27 වෙනි දින අංක 603 බී 6 ජී 143 දරණ බල පත්‍රය පිට වවන ලද රබර් වැවිල්ලද වේ.

2. තවලම පිහිටා තිබෙන අක්කර 14යි, රූඩ් 0, පර්චස් 4 ක් බිම් ප්‍රමාණ ඇති මන්දාගල නොහොත් පහළ ගමගේ මහ වත්ත යන ඉඩමෙන් නොබෙදාපු (2/15) සහ එයට අයත් බිම සහ ගහ කොළ, සම්පූර්ණ තේ වගාව සහ 11 රියන් උළු සෙවිලි කළ ගෙය දැනට දිගින් අඩි 63 ක් සහ පළලින් අඩි 57 ක් වූ තේ පැක්ටරිය කට යොදවා ඇත. එහි ඇති යාන්ත්‍රික ආම්පන්න සහ යන්ත්‍ර සූත්‍ර නම් අංක 44193 දරණ හස්ටන් හොනස්ට් යන්ත්‍රය, නව රොබිසන් යන්ත්‍රය, තේ වේලන යන්ත්‍ර එකයි, අඟල් 24 ක් ප්‍රමාණ ඇති සහ බැටන් හයකින් යුත් රෝල් බ්‍රේකර් එකයි, කොටස් හයකින් යුත් වී බින්ස් හයයි, එහි තිබෙන සියලු දේද වේ. (මේ පැක්ටරිය කඩා වැටී යන්ත්‍ර සූත්‍ර බොහොමයක් අඩු අතර අනික්වා දිරාපත් වී සම්පූර්ණයෙන් වල් බිහි වී ඇත).

3. තවලම පිහිටා තිබෙන අක්කර 2 ක් බිම් ප්‍රමාණ ඇති කම්පෙත්තගහ කුඹුර යන ඉඩමේ සියලු ගහ කොළ සහ පළතුරු සහ බිම ද එහි තිබෙන ටී. ජේ. අයි. දරණ බඩ් රබර් වැවිල්ල වේ.

ඒ. ඇල්. කේ. ඇල්. බණ්ඩාර,
1973 ජනවාරි 10 වැනි දින දී ය. උසාවියේ කොමසාරිස් තැන.

2-331—73.02.09 දින අංක 46 දරණ ගැසට් පත්‍රය

---

## විවිධ දැන්වීම්

### කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

#### වාණිජ චිත්‍ර ශිල්පීන් ලියා පදිංචි කිරීම

කොළඹ 1, බ්‍රිස්ටල් වීදියේ හේමාස් ගොඩනැගිල්ලේ කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ තැන විසින් දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි කිරීම සඳහා සුප්‍රසිද්ධ වාණිජ චිත්‍ර ශිල්පීන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. චිත්‍ර පටි, වෙළඳ දැන්වීම් හා අනිකුත් ප්‍රචාරක කටයුතු සඳහා අවශ්‍ය වූ විට මෙසේ දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි වී ඇති චිත්‍ර ශිල්පීන්ගෙන් පමණක් මිලගණන් කැඳවනු ඇත.

2. මේ සඳහා එවන සියලුම ඉල්ලුම් පත් 1973. 3. 5 දිනට හෝ ඉන් ප්‍රථම ඉහත සඳහන් ලිපිනයට එවිය යුතුය.

3. වැඩි විස්තර සඳහා කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ තැනගෙන් විමසන්න.

සෝමපාල ගුණධීර,
කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ.

යොමු අංකය. 3/3/3/277,
1973. 1. 30.

2-353/1—73.02.09 දින අංක 46 දරණ ගැසට් පත්‍රය

---

### කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

#### වෙළඳ ප්‍රචාරක ආයතන ලියාපදිංචි කිරීම

කොළඹ බ්‍රිස්ටල් වීදියේ හේමාස් ගොඩනැගිල්ලේ කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ විසින් එම දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි කිරීම සඳහා ප්‍රකට වෙළඳ ප්‍රචාරක ආයතන වලින් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. දෙපාර්තමේන්තුවේ වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා අවශ්‍ය වූ විට මෙසේ ලියාපදිංචි වූ අයගෙන් පමණක් මිල ගණන් කැඳවනු ඇත.

2. මේ සඳහා එවන සියලුම ඉල්ලුම් පත් 1973. 3. 5 දිනට හෝ ඉන් ප්‍රථම ඉහත සඳහන් ලිපිනයට එවිය යුතුයි.

3. වැඩි විස්තර සඳහා කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ තැනගෙන් විමසන්න.

සෝමපාල ගුණධීර,
කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ.

යොමු අංකය. 3/3/3/277,
1973. 1. 30.

2-353/2—73.02.09 දින අංක 46 දරණ ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

### 1973

| මාසය | පළකිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | |
|---|---|---|---|
| ජනවාරි — | 73. 1. 5 සිකුරාද ... | 72.12.27 බදාදා | දවල් 12.00 |
| | 73. 1.12 සිකුරාද ... | 73. 1. 3 බදාදා | දවල් 12.00 |
| | 73. 1.19 සිකුරාද ... | 73. 1.10 බදාදා | දවල් 12.00 |
| | 73. 1.26 සිකුරාද | 73. 1.17 බදාදා | දවල් 12.00 |
| පෙබරවාරි — | 73. 2. 2 සිකුරාද ... | 73. 1.24 බදාදා | දවල් 12.00 |
| | 73. 2. 9 සිකුරාද ... | 73. 1.31 බදාදා | දවල් 12.00 |
| | 73. 2.15 බ්‍රහස්පතින්ද ... | 73. 2. 7 බදාදා | දවල් 12.00 |
| | 73. 2.23 සිකුරාද ... | 73. 2.14 බදාදා | දවල් 12.00 |
| මාර්තු | 73. 3. 2 සිකුරාද ... | 73. 2.21 බදාදා | දවල් 12.00 |
| | 73. 3. 9 සිකුරාද ... | 73. 2.28 බදාදා | දවල් 12.00 |
| | 73. 3.16 සිකුරාද ... | 73. 3. 7 බදාදා | දවල් 12.00 |
| | 73. 3.23 සිකුරාද ... | 73. 3.14 බදාදා | දවල් 12.00 |
| | 73. 3.30 සිකුරාද — | 73. 3.21 බදාදා | දවල් 12.00 |
| අප්‍රේල් — | 73. 4. 6 සිකුරාද — | 73. 3.28 බදාදා | දවල් 12.00 |
| | 73. 4.11 බදාදා ... | 73. 4. 4 බදාදා | දවල් 12.00 |
| | 73. 4.19 බ්‍රහස්පතින්ද — | 73. 4.11 බදාදා | දවල් 12.00 |
| | 73. 4.27 සිකුරාද — | 73. 4.18 බදාදා | දවල් 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 ඔක්තෝබර් මස 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.